# ANNUAL REPORT 2010




## POSTGRADUATE INSTITUTE OF MEDICINE
## UNIVERSITY OF COLOMBO

# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# වාර්ෂික වාර්තාව

✦

✦

## 2010

# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
# කොළඹ විශ්ව විද්‍යාලය
# වාර්ෂික වාර්තාව 2010



අධ්‍යක්‍ෂතුමාගේ පණිවුඩය,

2010 වර්ෂයට අදාල වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම ගැන බෙහෙවින් සතුටු වෙමි.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ විධි විධාන යටතේ සකස් කරන ලද 1980 අංක 1 දරණ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයක් වශයෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවන ලදී. තිස් වසරක පැවැත්මෙන් අනතුරුව එය දිවයිනේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම පිණිස විශේෂඥ වෛද්‍යවරුන් බිහිකිරීම මඟින් දිවයිනට අමිල සේවයක් ඉටුකරන ප්‍රමුඛතම ආයතනයක් බවට පත්වී ඇත. ඊට අමතරව මෙම ආයතනය විශ්වවිද්‍යාල, ආරක්ෂක සේවාවන්හි හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වෛද්‍යවරුන්ගේ මානව සම්පත් සංවර්ධන අවශ්‍යතාවන් ඉටුකරමින් මාහැඟි කාර්යභාරයක් ඉටු කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මහා භාණ්ඩාගාරය මෙම ආයතනය සඳහා මූල්‍ය සම්පත් සපයන අතර ආයතනයද සිය මූල්‍ය අවශ්‍යතාවලින් අඩක් පමණ උපයා ගනී.

පුස්තකාලයද ඇතුළුව ශාස්ත්‍රීය කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැතිකමත්, බුද්ධිගලනයත්, ස්ථිර කථිකාචාර්ය මණ්ඩලයක් නොමැතිවීමත් යන කරුණු මෙම ආයතනයේ මතු දියුණුව වෙනුවෙන් ඉක්මණින්ම අවධානයට යොමුවිය යුතු අංග වශයෙන් දැක්විය හැකිය. මෙම අංශයන්ගේ දියුණුව රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම නවක වෛද්‍යවරුන්ගේ අධ්‍යාපනික අපේක්ෂාවන් මල්ඵල ගැන්වීමත් ආයතනයේ ශාස්ත්‍රීය කටයුතුවල ගුණාත්මක තත්ත්වය නැංවීම සඳහාත් අත්‍යවශ්‍ය වේ.

සමාලෝචිත වර්ෂය තුලදී ආයතනය ශාස්ත්‍රීය කටයුතුවලින් ජයග්‍රහණ ගණනාවක් අත්කරගෙන ඇත. බහුවිෂය ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලය හා මූලික හා වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය යටතේ විශේෂඥ ක්ෂේත්‍ර මණ්ඩල ගණනාවක්ම පිහිටවන ලද අතර නව පාඨමාලා සංස්ථාපය කිරීමට අවශ්‍ය විෂයමාලා සංවර්ධන කටයුතු රාශියක්ම මෙම විශේෂඥ ක්ෂේත්‍ර මණ්ඩල මඟින් කරගෙනයන ලදී.

විශේෂඥ පුහුණු වැඩසටහන් ව්‍යප්තිය පිණිසත් එම පාඨමාලාවන්හි ශාස්ත්‍රීය කටයුතු මන්තු කිරීම පිණිසත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු පත්කරගැනීමට අවශ්‍ය කටයුතු 2010 වර්ෂය තුළදී කරගෙනයන ලදී.

ආයතනයේ කළමණාකරණ මණ්ඩලය, අධ්‍යයන මණ්ඩල, පරීක්ෂණ මණ්ඩල, විශේෂඥ ක්ෂේත්‍ර මණ්ඩලයන්හි සාමාජිකභවතුන් හා ආයතනයේ අනධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයන් විසින් සමාලෝචිත වර්ෂය තුලදී ආයතනයේ ශාස්ත්‍රීය හා පරිපාලන කටයුතු කරගෙනයාමේදී ලබාදුන් අනුග්‍රහයත් 2010 වාර්ෂික වාර්තාව සම්පාදනය කොට එය සිංහල බසට පරිවර්තනය කරමින් බී.ජී. චන්ද්‍රදාස මහතා විසින් ඉටුකල කාර්යභාරයත් විශේෂයෙන්ම අගය කරමී.

විද්‍යාජ්‍යෝති මහාචාර්ය රිස්වි ෂෙරිෆ්
අධ්‍යක්‍ෂ/වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කායික වෛද්‍යවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්‍ය
කොළඹ විශ්වවිද්‍යාලයය

## ආයතනයේ දර්ශනය හා මෙහෙවර

### 1.1දර්ශනය (Vision )

පරිපාලනමය හා මූල්‍යමය වශයෙන් ස්වාධීන, විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථානයක් ලෙස ජාත්‍යන්තරව පිළිගනු ලබන, දිවයිනේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම පිණිස ඉහළ වෘත්තීය ප්‍රමිතීන්ගෙන් පරිපූර්ණ විශේෂඥ වෛද්‍යවරුන් සහ වෙනත් වෘත්තිකයන් බිහිකරන කලාපීය හා ලෝක සෞඛ්‍ය සේවාවන්ට සාධනීය මට්ටමින් දායකත්වය ලබාදෙන ආයතනයක් වීමත් ස්වාධීන විශ්වවිද්‍යාල තත්ත්වයක් ලබාගැනීමත් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දර්ශනය වේ.

### 1.2 මෙහෙවර (Mission )

කලාපීය හා ලෝක මට්ටමින් අප වෙත පැවරී ඇති පුළුල් වගකීම් සම්භාරය පිළිබඳව අවබෝධයෙන් යුතුව, ශ්‍රී ලංකාවාසීන්ට ප්‍රශස්ථ මානවවාදී සෞඛ්‍ය සේවාවක් සැපයීමට කැපවූ වෘත්තීය කුසලතාවන්ගෙන් හා ඉහළ ප්‍රමිතීන්ගෙන් පරිපූර්ණ විශේෂඥ වෛද්‍යවරුන් හා අනෙකුත් වෘත්තිකයන් බිහි කරලීමට අවශ්‍යවන්නා වූ පශ්චාත් උපාධි මට්ටමේ ශාස්ත්‍රීය පාඨමාලා හා පුහුණු වැඩ සටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමත් ඒවා අධීක්ෂණයත් එමෙන්ම ඇගයීම් ක්‍රම සැලසුම් කිරීමත් මෙම ආයතනයේ මෙහෙවර වේ.

## 2. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුණු

1. ජාතික අවශ්‍යතාවට සරිලන ප්‍රමාණයෙන් හා ඉහළ ගුණාත්මක භාවයෙන් පිරිපුන් විශේෂඥ වෛද්‍යවරුන් බිහි කිරීම.

2. අඛණ්ඩ වෛද්‍ය අධ්‍යාපනය තුළින් වෛද්‍යවරුන්ගේ හැකියාවන් හා නිපුණතා වර්ධනයට කටයුතු කිරීම.

3. වෛද්‍ය වෘත්තිකයන්ගේ අඛණ්ඩ වෛද්‍ය අධ්‍යාපන කටයුතු නැංවීම පහසුවන ආකාරයට ක්‍රම වේදයන් සැලසුම් කිරීම හා අභිනව ක්‍රම වේදයන් බිහි කිරීම.

4. වෛද්‍ය වෘත්තිකයන් තුල වර්ධනාත්මක ආකල්පයන් පෝෂණය හා ඔවුන් තුල ස්වයං අධ්‍යයන හැකියා ප්‍රවර්ධනය.

5. පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතු ප්‍රවර්ධනය සඳහා උචිත තාක්‍ෂණය උපයෝගී කර ගැනීමත් පවතින සම්පත් හැකි උපරිම අයුරින් භාවිතයත් වර්ධනය කිරීම.

6. සෞඛ්‍ය ගැටළු නිරාකරණය සඳහා සෞඛ්‍යාරක්‍ෂක කණ්ඩායම් ප්‍රවේශ සංකල්පය යොදා ගැනීමේ වැදගත්කම අවබෝධ කරවීම.

7. පවතින දෝෂ තත්වයන් වෙතොත් ඒවාද, ප්‍රවර්ධනය සඳහා අදාළවන දර්ශකයන් ද හඳුනා ගැනීමේ අරමුණින් පුහුණු අධ්‍යාපන පාඨමාලාවන් සමාලෝචනයට ලක් කිරීම.

8. රෝග වැළැක්වීම්, චිකිත්සා හා හෙද ආරක්‍ෂණ සේවා මැනවින් සමෝධානය වන ආකාරයෙන් සේවාස්ථ පුහුණු පාඨමාලා සංවර්ධනය කිරීම.

9. ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතු ඉහළ පිරිවිතරයන්ට අනුකූල වන ආකාරයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර්ජාතික අධ්‍යාපන ආයතන සමඟ සබඳතා පුළුල් කර ගැනීම .

## 2.1 ඓතිහාසික පසුබිම

ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපන කටයුතු 1870 වර්ෂයේදී කොළඹ වෛද්‍ය විද්‍යාලය පිහිටුවීමත් සමගම ආරම්භ විය. මෙම වෛද්‍ය විද්‍යාලය වසර 70 ක කාලයක් ස්වාධීන ආයතනයක් වශයෙන් පැවතුණි. අනතුරුව එය 1942 වර්ෂයේ දී පිහිට වූ ලංකා විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය බවට පත්විය.

1952 වර්ෂයේ දී පවත්වන ලද කායික වෛද්‍යවේදය පිළිබඳ වෛද්‍ය විශාරද උපාධි පරීක්ෂණයත්, ධාත්‍රීභෘත්‍යය හා නාරිවේදය පිළිබඳ ශල්‍ය විද්‍යාපති උපාධි පරීක්ෂණයත් 1953 වර්ෂයේ දී පවත්වන ලද ශල්‍යවේදය පිළිබඳ ශල්‍ය විද්‍යාපති උපාධි පරීක්ෂණයත් ලංකා විශ්ව විද්‍යාලය මගින් පවත්වන ලද මුල්ම පශ්චාත් උපාධි වෛද්‍ය පරීක්ෂණයන් ලෙස හැඳින්විය හැකිය. මෙම අවධියේදී පශ්චාත් උපාධි පරීක්ෂණයන් ඉලක්ක කොට පවත්වනු ලැබූ සංවිධානාත්මක සේවාස්ථ පුහුණු, පුහුණු වැඩ සටහන් හෝ පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා කිසිවක් නොතිබිණ. එක්සත් රාජධානියේ රාජකීය වෛද්‍ය විද්‍යායතන මගින් පිරිනමන ලද මනෝ වෛද්‍යවේදය, ව්‍යාධිවේදය, ධාත්‍රීභෘත්‍යය හා නාරිවේදය, කායික වෛද්‍යවේදය හා ශල්‍යවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතික එම අවධියේදී විශේෂඥ වෛද්‍ය පුරප්පාඩු පිරවීම සඳහා මූලික සුදුසුකමක් ලෙස මෙරට සෞඛ්‍ය අමාත්‍යංශය පිළිගෙන තිබුණි. එබැවින් පශ්චාත් උපාධි වෛද්‍ය පාඨමාලා හැදෑරීමටත් සේවාස්ථ විශේෂඥ පුහුණුව සඳහාත් එම අවධියේදී  මෙරට වෛද්‍යවරුන්හට එක්සත් රාජධානිය බලා යාමට සිදු වීය.

මෙම තත්ත්වය සලකා බැලූ පශ්චාත් උපාධි අධ්‍යාපන උපදේශක කමිටුව රාජකීය වෛද්‍ය විද්‍යායතන මගින් සකස් කර තිබූ පුහුණු පාඨමාලා හැදෑරීමේ අවශ්‍යතාවය වෙනුවට මෙරට මහ රෝහල්වලදී දේශීය විශේෂඥ වෛද්‍යවරුන්ගේ අධීක්ෂණය යටතේ ලබන්නා වූ වසර 03 ක සේවාස්ථ පුහුණුවත් ඉන් අනතුරුව ලබන්නාවූ වෛද්‍ය විශාරද හා ශල්‍ය විද්‍යාපති උපාධි සාමාර්ථයත් අදාල සුදුසුකම් වශයෙන් පිළිගතයුතු යයි 1973 වර්ෂයේ දී රජය වෙත නිර්දේශ කළේය.

එම නිර්දේශයට අනුකූලව රජය විසින් 1972 අංක 1 දරණ ලංකා විශ්ව විද්‍යාල පනතේ ප්‍රතිපාදන යටතේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිතව පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය ස්ථාපනය කරන ලදී.  එම ආයතනය පිහිටුවීමේ අරමුණ වූයේ පශ්චාත් උපාධි පරීක්ෂණ පැවැත්වීමය. 1976 මාර්තු මස 02 වැනි දින දී ලෝක සෞඛ්‍ය සංවිධානයේ නේවාසික නියෝජිත හාෆ්ඩන් මහ්ලර් මහතා විසින් එය නිල වශයෙන් විවෘත කරන ලද අතර මහාචාර්ය කේ.එන්. සෙනෙවිරත්න මහතා එහි ප්‍රථම අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.

කෙසේ වෙතත්, එක්සත් රාජධානියේ රාජකීය වෛද්‍ය විද්‍යායතන විසින් සිය පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණ මෙරට තුල තවදුරටත් පවත්වාගෙන යන ලදී, එම පරීක්ෂණ වලට පෙනී සිටීමට වෛද්‍යවරුන් වැඩි කැමැත්තක් දැක්වීම නව ආයතනයේ පරීක්ෂණ පැවැත්වීමට අහිතකර අන්දමින් බලපෑවේය. මේ තත්ත්වය සමාලෝචනයට ලක් කළ රජය 1980 ජනවාරි 01 වන දින සිට බලපාන පරිදි විදේශීය ආයතනයන් මගින් මෙරට තුළ පශ්චාත් උපාධි වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම අත්හිටුවීමට කටයුතු කළේය. එමෙන්ම, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් පවත්වනු ලබන පරීක්ෂණවලින් සමත් වන විශේෂඥ වෛද්‍යවරුන්හට රාජ්‍ය පිළිගැනීම ලබා දීමටත්, විශේෂඥ වෛද්‍ය තනතුරු පිරවීමේදී එම සමාර්ථ සඳහා ප්‍රමුඛතාවය ලබා දීමටත් කටයුතු කරන ලදී.

1979 වර්ෂයේදී, එවකට පැවති පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය වෙනුවට 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ සඳහන් ප්‍රතිපාදන යටතේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවන ලදී. එහි ප්‍රථම අධ්‍යක්ෂ ලෙස වෛද්‍ය එස්.ඒ. කබ්රාල් මහතා පත්කරන ලදී. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අදාල පණතේ විධිවිධානවලට අනුකූලව අනුමත කරන ලද අතර එය 1980 අප්‍රියෙල් 10 දින සිට බලාත්මක කරන ලදී. විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ පිහිටුවා තිබූ අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කරන ලද අතර පුහුණු පාඨමාලා හා පරීක්ෂණ විධිද ඒ අනුව යළි සකස් කරන ලදී.

අධ්‍යාපන අමාත්‍යංශය, සෞඛ්‍ය අමාත්‍යංශය, විශ්ව විද්‍යාල වෛද්‍ය පීඨ සහ වෘත්තීය විද්‍යායතන සමග වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඉතා සමීප සබඳතාවයකින් යුතුව කටයුතු කරයි. එහි කළමණාකරණ මණ්ඩලය අධ්‍යාපන, මුදල් සහ සෞඛ්‍ය යන අමාත්‍යංශවල ලේකම්වරුන්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, වෛද්‍ය පීඨ පීඨාධිපතිවරුන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති සහ එම කොමිෂම විසින් පත්කරනු ලබන විශිෂ්ඨ ගණයේ වෘත්තීයවේදීන් 08 දෙනෙකුගෙන් ද සමන්විත වේ.

## 3. උපකුලපතිතුමියගේ සමාලෝචනය

(අ) කෙටි හැඳින්වීමක්

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1980 අංක 01 දරණ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යටතේ පිහිටුවන ලද අතර කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත කරන ලදී. මෙම ආයතනය වෛද්‍ය ක්ෂේත්‍රයේ මූලික සහ උප විෂය ක්ෂේත්‍රයන්හි පාඨමාලා පැවැත්වීමත් පුහුණු කටයුතුත් පර්යේෂණ පැවැත්වීමත් ඉටු කරනු ලබයි. වෛද්‍ය විශාරදපති උපාධි මෙන්ම පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පරීක්ෂණ සඳහා වෛද්‍ය සහ දන්ත වෛද්‍යවරුන් පුහුණු කිරීමත් අවසන් පරීක්ෂණ සමත් වන අපේක්ෂකයන් සඳහා එම උපාධි සහ සහතිකපත්‍ර පිරිනැමීම සිදු කෙරේ. විශේෂඥ පුහුණු පාඨමාලා සාර්ථකව හදාරනු ලබන උපාධිධාරීන් හට විශේෂඥ වෛද්‍යවරුන් වශයෙන් මාණ්ඩලික සහතිකය පිරිනැමීම ද මෙම ආයතනයෙන් සිදුකෙරේ.

(ආ) ජයග්‍රහණ

මෙරටට අවශ්‍යය විශේෂඥ වෛද්‍යවරුන් බිහිකිරීමේ ලා පසුගිය වසර 30 ක පමණ කාලයක් තුල ඉමහත් කාර්යභාරයක් මෙම ආයතනය විසින් ඉටුකරනු ලැබ ඇත.

(ඇ) අසමර්ථතා හා සාධාරණීකරණය

ප්‍රමාණවත් තරම් ගොඩනැගිලි පහසුකම් නොමැතිවීමත් ආයතනය ව්‍යාප්ත කිරීමට අවශ්‍යය ඉඩම් ප්‍රමාණයක් නොමැතිවීමත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මණ්ඩලයන් බඳවා ගැනීමට අවශ්‍යය ප්‍රතිපාදන නොලැබීමත් ආයතනයේ සංවර්ධනයට එරෙහිවන ප්‍රධාන බාධක ලෙස දැක්විය හැකිය.

(ඈ) අනාගත සැලසුම්

සායනික නොවන විෂය ක්ෂේත්‍රයන්ට අදාලව නව පාඨමාලා හඳුන්වාදීමට ආයතනය සැලසුම් කොට ඇත.

ආයතනයේ ඉදිරි කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි පතමි.

මහාචාර්ය ශානිකා හිරිඹුරේගම
උපකුලපතිනි
කොළඹ විශ්වවිද්‍යාලය

## 4. සම්පත් සහ අභ්‍යාසලාභීන් පිළිබඳ විස්තර

| ආයතනය | පාඨමාලා | අභ්‍යාසලාභීන් සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩලය | අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | සේවාස්ථ පුහුණු | 99 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය - 01 | නියෝජ්‍ය ලේඛකාධිකාරී - |
| | සහතික පත්‍ර පාඨමාලා | 16 | ආධුනික කථිකාචාර්ය - 01 | නියෝජ්‍ය මූල්‍යාධිකාරී - 01 |
| | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 431 | අර්ධකාලීන පාඨමාලා අධ්‍යක්ෂ ( වෛද්‍ය පරිපාලන හා ප්‍රජා වෛද්‍ය) - 02 | සහකාර ලේඛකාධිකාරී - 03 |
| | පශ්චාත් උපාධි පාඨමාලා | 146 | | සහකාර මූල්‍යාධිකාරී -1 |
| | වෛද්‍ය විශාරද | 1738 | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්ථකාලයාධිකාරී - 02 | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර - 07 |
| | | | වැඩසටහන් සම්පාදක හා පද්ධති විශ්ලේෂක - 01 | මාණ්ඩලික සහකාර - 13 |
| | | | | ලිපිකාර හා සමාන්කර සේවා - 35 |
| | | | | කනිශ්ඨ සේවක භවතුන් - 21 |
| එකතුව | | 2430 | 07 | 81 |

## 5. දේශියව පුහුණුව ලබන අභ්‍යාසලාභීන්ට අදාල තොරතුරු

| ආයතනය | පාඨමාලා | මාධ්‍ය | ශිෂ්‍ය සංඛ්‍යාව | පලමු වසර | දෙවන වසර | තෙවන වසර | උපාධිධාරී සංඛ්‍යාව | සිව්වන වසර | පස්වන වසර | හයවන වසර |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | සේවාස්ථ/ සහතික පත්‍ර | ඉංග්‍රීසි | 71 | 101 | 14 | | | | | |
| | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | 229 | 391 | 40 | | 210 | | | |
| | පශ්චාත් උපාධි | | 81 | 52 | 94 | | 18 | | | |
| | වෛද්‍ය විශාරද | | 256 | 566 | 200 | 59 | 262 | 395 | 29 | 1 |
| | විදේශ පුහුණු | | | | | | | | 233 | 255 |
| එකතුව | | | 637 | 1110 | 348 | 59 | 490 | 395 | 262 | 256 |

වෛද්‍ය විශාරද උපාධිය හා වෛද්‍ය ක්ෂේත්‍රයන් හි මාණ්ඩලික සහතිකය අරමුණු කොට පවත්වනු ලබන විශේෂඥ පුහුණු පාඨමාලාවන් පළමු, දෙවනි සහ තුන්වන යන වසර තුනකින් ද සිව්වන, පස්වන සහ හය වන වසර වශයෙන් වන විශේෂඥ පුහුණු පාඨමාලා වසර වලින් ද සමන්විත වේ. වෛද්‍ය විශාරද උපාධිය ලැබීමෙන් අනතුරුව අභ්‍යාසලාභීන් දේශීයව හා විදේශිය වශයෙන් වැඩිදුර පුහුණුව ලැබිය යුතු වේ. අභ්‍යාසලාභීන් විසින් විශේෂඥ පුහුණු සඳහා තෝරාගනු ලබන විෂය ක්ෂේත්‍රය අනුව සම්පූර්ණ පුහුණු කාලය වෙනස් වේ. හෘද රෝග සම්බන්ධ විශේෂඥ පුහුණු පාඨමාලාවේ දේශිය පුහුණු කාලය වසර තුනකි. වෙනත් පාඨමාලාවන්හි පුහුණු කාලය මීට වඩා අඩුය.

## 06. විදේශ අභ්‍යාසලාභීන් පිළිබඳ විස්තර

| ආයතනය | පාඨමාලා | මාධ්‍ය | ශිෂ්‍ය සංඛ්‍යාව | පලමු වසර | දෙවන වසර | තෙවන වසර | සිව්වන වසර | උපාධිධාරී සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | නීති වෛද්‍ය ප/උ ඩිප්ලෝමාව | ඉංග්‍රීසි | 01 | 01 | | 01 | | |
| | වෛද්‍ය විශාරද කෞමාරභෘත්‍යය | ඉංග්‍රීසි | 01 | | | | | |
| එකතුව | | | 02 | 01 | | 01 | | |

## 07. අධ්‍යයන කාර්‍ය මණ්ඩලය පිළිබඳ විස්තර

| ආයතනය | පාඨමාලා | මාධ්‍ය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය | කතිකාචාර්ය | සහකාර කතිකාචාර්ය | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|
| වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | | | අධ්‍යක්ෂ | | | වෛද්‍ය අධ්‍යාපන ආධුනික කතිකාචාර්ය | | අර්ධකාලීන පාඨමාලා අධ්‍යක්ෂ ( වෛද්‍ය අධ්‍යාපන හා ප්‍රජා වෛද්‍ය) - 02 |
| | | | | | | | | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්ථකාලයාධිපති - 02 |
| | | | | | | | | සහකාර පුස්ථකා ලයාධිපති - 01 |
| | | | | | | | | වැඩසටහන් සම්පාදක හා පද්ධති විශ්ලේෂක - 01 |
| එකතුව | | | 01 | | | 01 | | 06 |

## 08. අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අදාල තොරතුරු

| ආයතනය | වඩාත් ජ්‍යේෂ්ඨ | ජ්‍යේෂ්ඨ | කණිෂ්ඨ | සුළු සේවක |
|---|---|---|---|---|
| වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පරිපාලන නිලධාරී | නියෝජ්‍ය ලේඛකාධිකාරී - නියෝජ්‍ය මූල්‍යාධිකාරී - 01 | ජ්‍යේෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | සහකාර ලේඛකාධිකාරී -03 සහකාර මූල්‍යාධිකාරී - 01 | විශේෂ ශ්‍රේණිය, පහල ශ්‍රේණිය, ශ්‍රේණි I, II, III -21 |
| ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | ජ්‍යේෂ්ඨ මාණ්ඩලික සහකාර - 07 | මාණ්ඩලික සහකාර - 13 | ශ්‍රේණි I, II, III -35 | |
| එකතුව | 08 | 13 | 39 | 21 |

## 09. පර්යේශණ නව සොයාගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ තොරතුරු

| විෂය | ප්‍රකාශිත | වාණිජමය | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| (අ) පර්යේෂකවරු සංඛ්‍යාව | - | - | - |
| (ආ) නව සොයාගැනීම් සංඛ්‍යාව | - | - | - |
| (ඇ) පලකල සඟරා සංඛ්‍යාව | | | |
| ග්‍රන්ථ සංඛ්‍යාව | | ඝණ බැම්ම රු 5000<br>සංගෘහිත තැටි රු 500 | |
| පළකල ලිපි සංඛ්‍යාව | | - | 2010 දෙසැම්බර් මස කැලණි විශ්ව විද්‍යාලයේදී පවත් වන ලද පුස්ථකාල සහ විඥාපන සේවා විද්වත් සංසදයේ ශාස්ත්‍රිය සැසිය |
| වෙනත් | | ඝණ බැම්ම රු 200<br>සංගෘහිත තැටි රු 250 | |
| එකතුව | | | |

## 10. වැඩසටහන් සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

| විෂය | සහභාගිත්වය | නිමා කිරීම් | ඉදිරිපත්කිරීම් |
|---|---|---|---|
| (අ) පශ්චාත් උපාධි විශේෂඥ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 26 | 26 | වැඩමුළු - 06 |
| (ආ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | 16 | 16 | ශාස්ත්‍රීය සැසි - 01 |
| (ඇ) උපාධි පාඨමාලා සංඛ්‍යාව | - | - | "How to get your research published" මැයෙන් වූ පස්දින පාඨමාලාව |
| (ඈ) ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | - | - | |
| (ඉ) සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව | 2 | 2 | |
| (ඊ) වෙනත් | | | |
| එකතුව | 44 | 44 | |

## 11. ලද ප්‍රදානයන් පිළිබඳ විස්තර

| විෂය | ප්‍රදානයන් සංඛ්‍යාව | ආචාර්ය භවතුන් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) දේශීය ප්‍රදාන | | | |
| (ආ) ජාතික මට්ටමේ ප්‍රදාන | ජාතික විද්‍යා පදනම් ප්‍රදානය ★<br>ජනාධිපති සම්මානය<br>ජාතික සෞඛ්‍ය සේවා ප්‍රදානය | | අදාල නොවේ |
| (ඇ) ජාත්‍යන්තර ප්‍රදාන | | | |
| (ඈ) වෙනත් | | | |
| එකතුව | | | |

★ වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රිස්වි ෂෙරිෆ් මහතාගේ මගපෙන්වීම යටතේ මධුමේහ රෝගය පිළිබඳව පැවැත් වූ සායනික පර්යේෂණ කටයුතු ඇගයීම පිණිස ජාතික විද්‍යා පදනම විසින් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රිස්වි ෂෙරිෆ් මහතා හට ජාතික මට්ටමේ ප්‍රදානයක් පිරිනමන ලදී. යුද්ධය හේතුවෙන් දේශීය වශයෙන් අවතැන්වූ පුද්ගලයන්ගේ සෞඛ්‍ය ගැටළු විසඳීම සම්බන්ධයෙන් ජාතික සෞඛ්‍ය සේවා ප්‍රදානය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රිස්වි ෂෙරිෆ් මහතාහට පිළිගන්වන ලදී. ඊට අමතරව 2006, 2007, 2008, 2009 වර්ෂ වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රදානයද ඒ මහතාහට 2010 වර්ෂයේදී ප්‍රදානය කරන ලදී.

## 12. ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර

| ආයතනය | පාඨමාලා | මාධ්‍ය | සහතිකපත්‍ර | ඩිප්ලෝමා | ප/උ ඩිප්ලෝමා | පති උපාධි | එම් ෆිල් උපාධි | ආචාර්ය උපාධිය |
|---|---|---|---|---|---|---|---|---|
| | - | - | - | - | - | - | - | - |
| | - | - | - | - | - | - | - | - |
| එකතුව | - | - | - | - | - | - | - | - |

## 13. පුනරාවර්ථන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2009 රුපියල් | 2010 රුපියල් |
|---|---|---|
| (අ) පුද්ගල වේතන | 45,654,336/- | 50,624,423/- |
| (ආ) ගමන් වියදම් | 5,977,589/- | 6,304,450/- |
| (ඇ) සැපයුම් | 6,410,950/- | 6,099,831/- |
| (ඈ) නඩත්තු | 2,244,410/- | 2,610,877/- |
| (ඉ) කොන්ත්‍රාත්සේවා | 11,636,508/- | 13,726,134/- |
| (ඊ) වෙනත් පුනරාවර්ථන වැයකිරීම් | 29,754,679/- | 26,678,122/- |
| (උ) පශ්චාත් උපාධි පුහුණු වැය | 23,580,936/- | 21,605,495/- |
| එකතුව | 125,259,408/- | 127,649,332/- |

**14. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර**

| විෂය | 2009<br>රුපියල් | 2010<br>රුපියල් |
|---|---|---|
| (අ) ලීබඩු සහ උපකරණ අත්පත් කරගැනීම් | 2,679,868/- | 4,441,256/- |
| (ආ) රසායනාගාර සහ ඉගැන්වීම් උපකරණ අත්යත්කරගැනීම් | 506,075/- | 1,015,504/- |
| (ඇ) ගොඩනැගිලි අත්පත් කරගැනීම් සහ ව්‍යුහ වැඩිදියුණු කිරීම් | 2,109,253/- | 2,281,719/- |
| (ඉ) ග්‍රන්ථ සහ වාර සඟරා මිළදී ගැනීම් | 11,258,063/- | 16,232,744/- |
| (ඊ) වෙනත් (වාහන) | 10,144,100/- | 92,000/- |
| එකතුව | 26,697,359/- | 24,063,223/- |

**15. දේශීය සහ විදේශීය මූල්‍යාධාර මතින් කෙරෙන ව්‍යාපෘති**

| නම සහ විස්තර | ණය/ ප්‍රදාන | ඒජන්සිය | පූර්ණ වැය ඇස්තමේන්තුව | RFA | DF |
|---|---|---|---|---|---|
| (අ) ජීව වෛද්‍ය විඥානය පිළිබඳ පති උපාධි අධයයන කටයුතු සඳහා වන නෝරාඩ් වැඩසටහන (NOMA) | ප්‍රදානයකි | ඔස්ලෝ විශ්වවිද්‍යාලය | 77,591,919/- | අදාල නොවේ | අදාල නොවේ |
| (ආ) දුරස්ථ අධ්‍යාපන නවීකරණ වැඩසටහන | ප්‍රදානයකි | | 7,568,536/- | අදාල නොවේ | අදාල නොවේ |
| එකතුව | | | 85,160,455/- | | |

වාර්ෂික මූල්‍ය ප්‍රදානය ව්‍යාපෘති ආරම්භයේදීම ලබාදේ.

**16. දේශීය සහ විදේශීය මූල්‍යාධාර මතින් කෙරෙන ව්‍යාපෘතිවල වැය පිළිබඳ විස්තර**

| නම | පූර්ණ වැය ඇස්තමේන්තුව | 2009 වසරේ වැය | 2010 වසරේ වැය | 2010-12-31 දිනට එකතුවූ වැය | භෞතික වර්ධනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| (අ) ජීව වෛද්‍ය විඥානය පිළිබඳ පති උපාධි අධ්‍යයන කටයුතු සඳහා වන නෝරාඩ් වැඩසටහන (NOMA) | 77,591,919/- | 25,866,612/- | 45,369,791/- | 71,236,403/- | |
| (ආ) දුරස්ථ අධ්‍යාපන නවීකරණ වැඩසටහන | 7,568,536/- | 1,456,594/- | 5,609,053/- | 7,065,647/- | |
| එකතුව | 85,160,455/- | 27,323,206/- | 50,978,844/- | 78,302,050/- | |

### 17. මූල්‍ය ප්‍රගතියට අදාල විස්තර (වැයකිරීම්)

| විෂය | 2010 ප්‍රතිපාදන | 2010 වසරේ වැය | ඉතිරිකිරීම් / අතිරික්තය |
|---|---|---|---|
| (අ) ව්‍යාපෘතිමය නොවන පුණරාවර්ථන වැය | 72,909,000/- | 127,649,332/- | (54,740,332)/- |
| (ආ) ව්‍යාපෘතිමය නොවන ප්‍රාග්ධන වැය | 3,500,000/- | 24,063,223/- | (20,563,223)/- |
| (ඇ) ව්‍යාපාතිය /දේශිය අරමුදල් | | | |
| (ඈ) ව්‍යෘපෘතිය /විදේශිය අරමුදල් | | | |
| එකතුව | 76,409,000/- | 151,712,555/- | (75,303,555)/- |

2010 වර්ෂය සඳහා වන මුලු මූල්‍ය ප්‍රතිපාදනය මිලියන 82ක් වූ අතර භාන්ඩාගාරයෙන් පුණරාවර්තන වියදම් සඳහා රුපියල් මිළියන 72.909 ක් ලැබීන

### 18. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ඉපැයූ ආදායම්)

| මූල්‍ය ප්‍රභවය | 2010 වසර සඳහා වූ ප්‍රතිපාදන රුපියල් | 2010 වසරේදී මුළු ඉපැයිම් රුපියල් | හිඟය/අතිරික්තය රුපියල් |
|---|---|---|---|
| (අ) ප්‍රථම උපාධි අධ්‍යයන කටයුතු | - | - | - |
| (ආ) පශ්චාත් උපාධි අධයයන කටයුතු | 65,000,000/- | 87,768,862/- | 22,768,862/- |
| (ඇ) උපදේශක සේවා | - | - | - |
| (ඈ) වෙනත් | 8,810,000/- | 16,459,774/- | 7,649,774/- |
| එකතුව | 73,810,000/- | 104,228,636/- | 30,418,636/- |

### 19. මූල්‍ය කටයුතු හැසිරවීම් පිළිබඳ විශ්ලේෂණය 2010

| විෂය | සූත්‍රය | ශිෂ්‍යයකු වෙනුවෙන් දරණ වැය |
|---|---|---|
| (අ) ශිෂ්‍යයකු වෙනුවෙන් දරණ පුනරාවර්ථන වැය | පුනරාවර්තන වැය/ ශිෂ්‍ය සංඛ්‍යාව | 65,731/- |
| (ආ)ශිෂ්‍යයකු වෙනුවෙන් දරණ ප්‍රාග්ධන වැය | ප්‍රාග්ධන වැය/ ශිෂ්‍ය සංඛ්‍යාව | 12,391/- |
| එකතුව | | |

### 20. 2010 වර්ශය තුලදී ලත් යටිතල පහසුකම් පිළිබඳ විස්තර

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | වැය | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| දුරකථන ජාලයක් ස්ථාපනය කිරීම | 170,100.00 | නිමකරනලදී |
| අභ්‍යන්තර දුරකථන ජාලය පුළුල් කිරීම | 8,164.00 | නිමකරනලදී |
| දේශන ශාලාවක් ඉදිකිරීම | 860,370.63 | නිමකරනලදී |
| අංක 4 දරණ දේශන ශාලාව ඉදිකිරීම | 645,923.80 | නිමකරනලදී |

## 21 වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආතනයේ කාර්ය සාධනය

1980-2010 කාලය තුළ දී වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආතනය විසින් අභ්‍යාසලාභීන් 6898 දෙනෙකු පුහුණු කොට ඇත (වගු අංක 01)

**වගු අංක 01: 1980-2010 කාලය තුළ දී පුහුණු කරන ලද අභ්‍යාසලාභීන් පිළිබඳ විස්තර**

| | 1980-2009 | 2010 | එකතුව |
|---|---|---|---|
| වෛද්‍ය විශාරද / ශල්‍ය වෛද්‍යපති උපාධිධාරීන් සංඛ්‍යාව | 3310 | 262 | 3572 |
| විද්‍යාපති උපාධිධාරීන් සංඛ්‍යාව | 640 | 18 | 658 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව | 2948 | 210 | 3158 |
| පශ්චාත් උපාධිධාරීන් මුළු එකතුව | 6898 | 490 | 7388 |

**වගු අංක 02 2010 වර්ෂය තුල දී පුහුණුව ලද අභ්‍යාසලාභීන් සංඛ්‍යාව**

**වගු අංක 02: 2010 වර්ෂයේ අභ්‍යාසලාභින් සංඛ්‍යාව**

| 2010 වර්ෂයේ නව ප්‍රවේශක සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|
| සේවාස්ථ පුහුණු වැඩසටහන් | 55 | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 229 | |
| විද්‍යාපති පාඨමාලා | 81 | |
| වෛද්‍ය විශාරද සහ ශල්‍ය වෛද්‍යපති පාඨමාලා | 256 | |
| සහතිකපත්‍ර පාඨමාලා | 16 | |
| එකතුව | | 637 |
| 2010 වර්ෂය තුල පාඨමාලා හැදෑරූ මුළු අභ්‍යාසලාභින් සංඛ්‍යාව | | |
| සේවාස්ථ පුහුණු සහ සහතිකපත්‍ර පාඨමාලා | 115 | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 431 | |
| විද්‍යාපති පාඨමාලා | 146 | |
| පූර්ව වෛද්‍ය විශාරද / ශල්‍ය වෛද්‍යපති පාඨමාලා | 825 | |
| පශ්චාත් වෛද්‍ය විශාරද / ශල්‍ය වෛද්‍යපති පාඨමාලා (දේශීය පුහුණු) | 425 | |
| පශ්චාත් වෛද්‍ය විශාරද / ශල්‍ය වෛද්‍යපති පාඨමාලා (විදේශීය පුහුණු) | 488 | |
| මුළු අභ්‍යාසලාභීන් සංඛ්‍යාව | | 2430 |

**වගු අංක 03: 2010 වර්ෂය තුලදී පැවැත් වූ විභාග සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| පැවැත්වූ විභාග සංඛ්‍යාව | | 113 |
| සහතිකපත්‍ර | 09 | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 12 | |
| මොඩියුල් I | 01 | |
| මොඩියුල් II | 01 | |
| මොඩියුල් III | 02 | |
| ප්‍රථම කොටස පරීක්ෂණ | 10 | |
| විද්‍යාපති | 02 | |
| අවසන් පරීක්ෂණ/ මොඩියුල් IV | 29 | |
| ප්‍රථම කොටස (අ) පරීක්ෂණ | 02 | |
| ප්‍රථම කොටස (ආ) පරීක්ෂණ | 02 | |
| සෙමිස්ට පරීක්ෂණ | 08 | |
| ප්‍රවේශ පරීක්ෂණ | 35 | |

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 1980 සිට 2010 දක්වා කාලය තුළ අභ්‍යාසලාභීන් 2148 දෙනෙකු හට විශේෂඥ වෛද්‍යවරුන් වශයෙන් මාණ්ඩලික සහතිකය පිරිනමා ඇත. ඉන් විශේෂඥ වෛද්‍යවරුන් 182 දෙදෙනෙකු එම සහතිකය ලබා ඇත්තේ 2010 වසර තුලදීය.

**වගු අංක 4 : මාණ්ඩලික සහතික ලත් විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව 1980-2010**

| විෂය ක්ෂෙත්‍රය | 1980-2009 | 2010 | එකතුව |
|---|---|---|---|
| නිර්වින්දන වෛද්‍යවේදය | 137 | 13 | 150 |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව | 139 | 10 | 149 |
| ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව | 09 | 05 | 14 |
| දන්ත ශල්‍යවේදය | 27 | - | 27 |
| මුඛ ශල්‍යවේදය | 10 | 01 | 11 |
| දන්ත සෘජුකරණවේදය | 20 | 03 | 23 |
| දන්ත පිළිසකරවේදය | 09 | 03 | 12 |
| චර්ම වෛද්‍යවේදය | 41 | 04 | 45 |
| පවුල් වෛද්‍යවේදය | 18 | - | 18 |
| අධිකරණ වෛද්‍යවේදය | 56 | 06 | 62 |
| කායික වෛද්‍යවේදය | 255 | 30 | 285 |
| හෘද වෛද්‍යවේදය | 39 | 02 | 41 |
| හෘද විද්‍යුත් භෞතවේදය | 03 | - | 03 |
| ස්නායු වෛද්‍යවේදය | 25 | 02 | 27 |
| වෘක්කවේදය | 08 | 01 | 09 |
| ස්නායු භෞතවේදය | 02 | - | 02 |
| ශ්වසන වෛද්‍යවේදය | 18 | 01 | 19 |
| රක්තවාතවේදය හා පුනරුත්ථාපනය | 21 | 02 | 23 |
| ජඨරික ආන්ත්‍රිකවේදය | 03 | 02 | 05 |
| අන්තරාසර්ග වෛද්‍යවේදය | 05 | 01 | 06 |
| වෛද්‍ය පරිපාලනය | 01 | 06 | 07 |
| ක්ෂුද්‍රජීව වෛද්‍යවේදය | 59 | 04 | 63 |
| පරපෝෂිත වෛද්‍යවේදය | 04 | - | 04 |
| ධාත්‍රීභෘත්‍යය හා නාරිවේදය | 191 | 12 | 203 |
| නාරිවේදමය පිළිකා ශල්‍යවේදය | 03 | 02 | 05 |
| අක්ෂි වෛද්‍යවේදය | 75 | 06 | 81 |
| නාසාකණ්ඨස්වරාලවේදය | 34 | 03 | 37 |
| කෞමාරභෘත්‍යය | 196 | 16 | 212 |
| දාරක හෘද වෛද්‍යවේදය | 01 | 01 | 02 |
| දාරක ස්නායු වේදය | 02 | - | 02 |
| දාරක වෘක්කවේදය | 01 | - | 01 |
| නවජ සූති වෛද්‍යවේදය | 01 | 01 | 02 |
| පටක ව්‍යාධිවේදය | 77 | 01 | 78 |
| රුධිර ව්‍යාධිවේදය | 35 | 09 | 44 |
| රසායනික ව්‍යාධිවේදය | 08 | - | 08 |
| රුධිර පාරවිලයන වෛද්‍යවේදය | 04 | 03 | 07 |
| ලිංගාශ්‍රිත රෝග වේදය | 01 | 01 | 02 |
| මනෝ වෛද්‍යවේදය | 48 | 03 | 51 |
| විකිරණ වේදය | 97 | 09 | 106 |
| ශායනික නියෝ ප්ලාස්ම වේදය | 25 | 03 | 28 |
| ශල්‍ය වෛද්‍යවේදය | 139 | 09 | 148 |
| හෘද උරස් ශල්‍යවේදය | 17 | - | 17 |
| පිළිකා ශල්‍යවේදය | 07 | 02 | 09 |
| මෞත්‍ර ලිංගික ශල්‍යවේදය | 18 | - | 18 |
| ජඨරික ආන්ත්‍රික ශල්‍යවේදය | 09 | 01 | 10 |
| ස්නායු ශල්‍යවේදය | 12 | 02 | 14 |
| විකලාංග ශල්‍යවේදය | 33 | - | 33 |
| දාරක ශල්‍යවේදය | 13 | - | 13 |
| සුවිකාරක ශල්‍යවේදය | 07 | - | 07 |
| වාහිනීමය හා ඉන්ද්‍රිය බද්ධ ශල්‍යවේදය | 03 | 02 | 05 |
| උරස් ශල්‍යවේදය | 01 | - | 01 |
| **එකතුව** | **1966** | **182** | **2148** |

ඇමුණුම 02

2010 වර්ෂය තුලදී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා ලේඛනගත වී සිටි අභ්‍යාසලාභීන් සංඛ්‍යාව (31-12-2010 දක්වා)

| | නව ප්‍රවේශ | සේවාස්ථ/ ඩිප්ලෝමා | | විද්‍යාපති | පූර්ව MD/ MS | පශ්චාත් MD/MS | පශ්චාත් MD/MS | මුළු එකතුව 1+2+3+4+5 |
|---|---|---|---|---|---|---|---|---|
| | | සේ/ස | ඩි | | | දේශීය | විදේශීය | |
| | | 1 | | 2 | 3 | 4 | 5 | |
| නිර්වින්දන වෛද්‍යවේදය | 15 | - | - | - | 49 | 14 | 42 | 105 |
| ශායනික නියෝප්ලාස්මවේදය (සේවාස්ථ පුහුණු) | 4 | 10 | - | - | - | - | - | 10 |
| ශායනික නියෝප්ලාස්මවේදය (වෛද්‍ය විශාරද) | 2 | - | - | - | 13 | 11 | 10 | 34 |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව (විද්‍යාපති) | 25 | - | - | 25 | - | - | - | 25 |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව (වෛද්‍ය විශාරද) | 19 | - | - | - | 56 | - | 21 | 77 |
| ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව (විද්‍යාපති) | 5 | - | - | 5 | - | - | - | 5 |
| ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව (වෛද්‍ය විශාරද) | 2 | - | - | - | 6 | - | 4 | 10 |
| චර්ම වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 5 | - | - | - | 16 | 11 | 15 | 42 |
| මුඛ ශල්‍යවේදය (වෛද්‍ය විශාරද/ශල්‍ය වෛද්‍යපති) | 3 | - | - | - | 3 | 6 | 3 | 12 |
| දන්ත පිලිසකරවේදය (වෛද්‍ය විශාරද/ශල්‍ය වෛද්‍යපති) | 3 | - | - | - | 7 | - | 3 | 10 |
| දන්ත ඍජුකරණවේදය (වෛද්‍ය විශාරද/ශල්‍ය වෛද්‍යපති) | 3 | - | - | - | 8 | - | 4 | 12 |
| පශ්චාත් උපාධි දන්ත වෛද්‍ය ඩිප්ලෝමා පාඨමාලාව (දුරස්ථ අධ්‍යාපන) | - | - | 8 | - | - | - | - | 8 |
| පශ්චාත් උපාධි රෝහල් දන්ත වෛද්‍ය ඩිප්ලෝමා පාඨමාලාව | 26 | - | 38 | - | - | - | - | 38 |
| පශ්චාත් උපාධි පවුල් වෛද්‍ය ඩිප්ලෝමා පාඨමාලාව | 53 | - | 53 | - | - | - | - | 53 |
| පවුල් වෛද්‍ය වේදය (වෛද්‍ය විශාරද) | - | - | - | - | 9 | - | 1 | 10 |
| නීති වෛද්‍ය විද්‍යාව පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 6 | - | 29 | - | - | - | - | 29 |
| අධිකරණ වෛද්‍ය විද්‍යාව (වෛද්‍ය විශාරද) | 8 | - | - | - | 15 | 4 | 4 | 23 |
| වෛද්‍ය පරිපාලනය (විද්‍යාපති) | 22 | - | - | 22 | - | - | - | 22 |
| වෛද්‍ය පරිපාලනය ( වෛද්‍ය විශාරද) | - | - | - | - | 29 | 1 | 19 | 49 |
| කායික වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 66 | - | - | - | 178 | 121 | 97 | 396 |
| ක්ෂය රෝගය හා ලය රෝග පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 18 | - | 18 | - | - | - | - | 18 |
| ක්ෂුද්‍රජීව වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 8 | - | - | - | 26 | 7 | 5 | 38 |
| පරපෝෂිත වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | - | - | - | - | 1 | - | 3 | 4 |
| වෛරස වේදය පිළිබඳ වෛද්‍යවේදය | 2 | - | - | - | 4 | 2 | - | 6 |
| ක්ෂුද්‍රජීව වෛද්‍යවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 11 | - | 21 | - | - | - | - | 21 |
| සායනික ක්ෂුද්‍රජීව වෛද්‍යවේදය පිළිබද ප/උ ඩිප්ලෝමාව | 5 | - | 5 | - | - | - | - | 5 |
| අණුක වෛද්‍යවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | - | - | 18 | - | - | - | - | 18 |
| ධාත්‍රීභෘත්‍යය හා නාරිවේදය (වෛද්‍ය විශාරද) | 5 | - | - | - | 24 | 23 | 28 | 75 |
| ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 10 | - | 20 | - | - | - | - | 20 |
| අක්ෂි වෛද්‍යවේදය (සේවාස්ථ පුහුණු) | 35 | 57 | - | - | - | - | - | 57 |
| අක්ෂි වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 2 | - | - | - | 9 | 7 | 9 | 25 |
| නාසාකණ්ඨස්වරාලවේදය (වෛද්‍ය විශාරද) | 6 | - | - | - | 9 | 5 | 10 | 24 |
| ව්‍යාධිවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | - | - | 22 | - | - | - | - | 22 |
| ව්‍යාධිවේදය (වෛද්‍ය විශාරද) | 9 | - | - | - | 45 | 23 | 27 | 95 |
| මුඛ ව්‍යාධිවේදය (වෛද්‍ය විශාරද) | - | - | - | - | 3 | - | - | 3 |
| රුධිර පාරවිලයන වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 2 | - | - | - | 7 | 3 | 8 | 18 |
| රුධිර පාරවිලයන පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 5 | - | 16 | - | - | - | - | 16 |
| කෞමාරභෘත්‍යය (වෛද්‍ය විශාරද) | 22 | - | - | - | 86 | 46 | 56 | 188 |
| ළමා සෞඛ්‍ය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 24 | - | 24 | - | - | - | - | 24 |
| මනෝ වෛද්‍යවේදය පිළිබද ප/උ ඩිප්ලෝමාව | 18 | - | 30 | - | - | - | - | 30 |
| මනෝ වෛද්‍යවේදය (වෛද්‍ය විශාරද) | 13 | - | - | - | 39 | 27 | 19 | 85 |
| විකිරණවේදය (සේවාස්ථ පුහුණු) | 16 | 32 | - | - | - | - | - | 32 |
| විකිරණවේදය (වෛද්‍ය විශාරද) | 24 | - | - | - | 39 | 18 | 32 | 89 |
| ක්‍රීඩා වෛද්‍යවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 11 | - | 11 | - | - | - | - | 11 |
| ශල්‍ය වෛද්‍යවේදය/ ශල්‍ය වෛද්‍යපති | 30 | - | - | - | 128 | 88 | 65 | 281 |
| සමාජ රෝගවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 6 | - | 16 | - | - | - | - | 16 |
| සමාජ රෝගවේදය (වෛද්‍ය විශාරද) | 7 | - | - | - | 16 | 8 | 3 | 27 |
| පවුල් වෛද්‍යවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව (මාර්ග ගත) | 31 | - | 64 | | - | - | - | 64 |
| සංකටක සත්කාර වෛද්‍යවේදය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | - | - | 24 | - | - | - | - | 24 |
| විෂ වෛද්‍යවේදය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව | - | - | - | 36 | - | - | - | 36 |
| ජෛව විඥාපන විද්‍යාපති පාඨමාලාව | 29 | - | - | 58 | - | - | - | 58 |
| වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 15 | 15 | - | - | - | - | - | 15 |
| වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ ප/උ ඩිප්ලෝමාව | 5 | - | 14 | - | - | - | - | 14 |
| සෞඛ්‍ය වෘත්තික අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 1 | 1 | - | - | - | - | - | 1 |
| **එකතුව** | **637** | **115** | **431** | **146** | **825** | **425** | **488** | **2430** |

## 22 ශාස්ත්‍රීය කටයුතු

**අභ්‍යාසලාභීන් ලේඛනගත කිරීම්**

2010 වසර තුළදී නව ප්‍රවේශයකින් 637 දෙනෙක්ද සහිතව අභ්‍යාසලාභීන් 2430 දෙනෙකු වෛද්‍ය විශාරද, වෛද්‍යපති, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, සහතිකපත්‍ර සහ නිපුනතා සහතිකපත්‍ර පාඨමාලාවන් හි පුහුණුව ලැබීම සඳහා ලේඛණගත කර තිබුණි. අභ්‍යාසලාභීන් 1942 දෙනෙකු දේශීය වශයෙන් පාඨමාලා හැදෑරූ අතර 488 දෙනෙකු විදේශයන්හි පුහුණුව ලදහ.

**ශාස්ත්‍රීය අවධාරණය**

2010 වර්ෂයේදීද ශාස්ත්‍රීය අවධාරණය වැඩි වශයෙන් යොමුකරන ලද්දේ ආයතනයේ පුහුණු හා ශාස්ත්‍රීය වැඩසටහන්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම පිණිසය. සමාලෝචිත වර්ෂය තුලදී වැඩමුළු ගණනාවක්ම පවත්වන ලදී. මීට අමතරව ශාස්ත්‍රීය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් 2010 වර්ෂය තුලදී ආයතනය විසින් ශාස්ත්‍රීය සැසි පවත්වන ලදී. ඊට අමතරව පාඨමාලා පවත්වාගෙන යාම පිණිස අවශ්‍යවන යටිතල පහසුකම්ද සපයන ලදී.

**උපාධි නාමය වෙනස් කිරීම**

මෙම ආයතනයේ කළමණාකරණ මණ්ඩලය විසින් 2009 වර්ෂයේදී විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රී කටයුතු සම්බන්ධ අධිකාරිය වන සනාතන සභාව වෙත 'ශල්‍ය වෛද්‍යපති' යන උපාධි නාමය 'වෛද්‍ය විශාරද ශල්‍ය වෛද්‍යවේදය' ලෙසින් වෙනස් කරන ලෙස නිර්දේශයක් ඉදිරිපත් කරන ලදී. ඒ සමඟම එම නිර්දේශය විශ්ව විද්‍යාලයේ පාලක සභාව වෙතද ඉදිරිපත් කරන ලදී. කළමණාකරණ මණ්ඩලය විසින් මෙම නිර්දේශය ඉදිරිපත් කරන ලද්දේ ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීවරුන් වශයෙන් දේශිය පුහුණුව අවසන් කොට වැඩිදුර පුහුණුව සඳහා විදේශගතවීමට අපේක්ෂාවෙන් පසුවූ අභ්‍යාසලාභීන් හට විදේශ පුහුණු මධ්‍යස්ථානයන්හි පුහුණු අවස්ථාවන් ලබා ගැනීම පිණිස 'ශල්‍ය වෛද්‍යපති උපාධි' නාමය කිසියම් අන්දමක අවාසි සහගත තත්ත්වයක් ඇති කොට තිබූ බැවිනි. මන්ද පුහුණු අවස්ථාවන් ලබාදීමේදී 'වෛද්‍ය විශාරද ශල්‍ය වෛද්‍යවේද' උපාධිය ලබා සිටි වෙනත් උපාධිධාරීන් හට වැඩි සැලකිල්ලක් එම ආයතන මගින් දැක්වීමත් එය පුහුණු අවස්ථා ලබා ගැනිමට උපකාරීවීමත්ය.

විශ්ව විද්‍යාලයේ සනාතන සභාව කළමණාකරණ මණ්ඩල නිර්දේශය 2009 අප්‍රේල් 29 වන දින පැවති රැස්වීමේදී අනුමත කරන ලද අතර 'වෛද්‍ය විශාරද ශල්‍ය වෛද්‍යවේද' උපාධිය පළමුවන වරට අවසන් පරීක්ෂණයෙන් සමත් වන අභ්‍යාසලාභීන්හට පිරිනැමීමට ඒ අනුව තීරණය කරන ලදී. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් සනාතන සභාව විසින් කොන්දේසියක්ද පනවන ලදී. එක්වරක් හෝ 'ශල්‍ය වෛද්‍යපති' උපාධි අවසන් පරීක්ෂණයට පෙනී සිට අසමත් වී ඇති අපේක්ෂකයන් හට 'ශල්‍ය වෛද්‍යපති' උපාධියම පිරිනැමිය යුතුය යන්න එම කොන්දේසිය විය.

2009 පෙබරවාරි මස සිට බලපැවැත්විය බවට තීරණය කරන ලද සනාතන සභා තීරණය 2010 වර්ෂයේදී පැවැත්වූ විශ්ව විද්‍යාලයීය උපාධි ප්‍රදානෝත්සවයේදී ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2010 වර්ෂයේදී අවසන් වසර පරීක්ෂණයෙන් සාමාර්ථය ලබා සිටි උපාධිධාරීන් හට 'වෛද්‍ය විශාරද ශල්‍ය වෛද්‍යවේදය' උපාධිය පිරිනැමීම ආරම්භ කරන ලදී.

'ශල්‍ය වෛද්‍යපති' අවසන් පරීක්ෂණයට පෙනී සිට අසමත් වී ඇති අපේක්ෂකයන් එම පරීක්ෂණයෙන් සාමාර්ථය ලබන තෙක් 'ශල්‍ය වෛද්‍යපති' අවසන් පරීක්ෂණය පැවැත්වීමට අදාල විධි විධාන යෙදිය යුතු බවට සනාතන සභාව තීරණය කර තිබූ බැවින් එම පරීක්ෂණය නොකඩවා පැවැත්වීමට අවශ්‍ය විධි විධාන යෙදීමට නියමිතය. එම අවසන් පරීක්ෂණයෙන් සමත් වන අභ්‍යාසලාභීන්හට 'ශල්‍ය වෛද්‍යපති' උපාධිය පිරිනැමේ.

## 23 ගරුනාම ප්‍රදානෝත්සවය (Titular Titles Award Ceremony) හා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ශාස්ත්‍රීය දේශනය (PGIM Oration)

2010 ඔක්තෝබර් මස 14 වන දින දී ආයතනය විසින් ගරුනාම ප්‍රදානය සඳහා ගරුනාම ප්‍රදානෝත්සවයක් ආයතන ශ්‍රවනාගාරයේ දී පවත්වන ලදී. ආයතනයේ වාර්ෂික ශාස්ත්‍රීය දේශනයද ඒ සමඟම පවත්වන ලදී.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් පවත්වා ගෙන යනු ලබන අධ්‍යයන කටයුතු හා පරීක්ෂණ පැවැත්වීම් සාර්ථක කර ගැනීම උදෙසා දායක වූ විශ්වවිද්‍යාල දේශක මණ්ඩලයට අයත් විද්වතුන් හා රෝහල් කාර්ය මණ්ඩලයට අයත් විශේෂඥ වෛද්‍යවරුන් විසින් ඉටු කරනු ලැබූ සම්භාවනීය සේවාවන් ඇගයීම වස් කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ හා පාලක සභාවේ අනුමැතිය සහිතව ගරුනාම

ප්‍රදානය කරන ලදී. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ තෙවන ශාස්ත්‍රීය දේශනයද ගරුනාම ප්‍රදානෝත්සවයට සමගාමීව පවත්වන ලදී. එම දේශනය රුහුණු විශ්වවිද්‍යාලයේ සායනික භිසග්වේද දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විශේෂඥ වෛද්‍ය ලක්ෂ්මි මැණික් හෙට්ටිහේවා මහත්මිය විසින් පවත්වන ලදී. එම ශාස්ත්‍රීය දේශනයේ මාතෘකාව වූයේ —Development of a realistic protocol for the assessment of Insulin resistance in diabetes mellitus and cardiovascular diseases; Sri Lankan perspective˜ යන්නය.

මෙම ගරුනාම ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූයේ උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු එස් බී දිසානායක මැතිතුමන් වූ අතර කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිනි මහාචාර්ය ශානිකා හිරිඹුරේගම මහත්මිය මෙම ගරුනාම ප්‍රදානෝත්සවයේ සහ ශාස්ත්‍රීය දේශනයේ ආරාධිත අමුත්තිය ලෙසින් සහභාගී වූවාය. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආරම්භක අවධියේදී ප්‍රමුඛයින් ලෙස කටයුතු කළ විශේෂඥ වෛද්‍ය ඈශ්මෝ අතපත්තු සහ වෛද්‍ය ක්ෂේත්‍රයේ තවත් ප්‍රවීණයන් කිහිපදෙනෙකු මෙම ගරුනාම ප්‍රදානෝත්සවයට සහභාගී වූ අතර එම විද්වතුන්ගේ සම්ප්‍රාප්තිය උළෙල වර්ණවත් කිරීමට හේතු විය.

පහත නම් සඳහන් විද්වතුන්හට මෙම ගරු නාම උළෙලේ දී ගරු නාම ප්‍රදානය කරන ලදී.

1. <u>වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ඡාත්‍ර (Fellow of the PGIM)</u>
   විශේෂඥ වෛද්‍ය එන් ජේ අබේගුණවර්ධන
   විශේෂඥ වෛද්‍ය කේ වී එම් ආරියරත්න
   විශේෂඥ වෛද්‍ය ඩී අසෝක ජයසේන
   විශේෂඥ වෛද්‍ය කේ එල් ආර් ජයතිස්ස
   විශේෂඥ වෛද්‍ය ආර් එම් පී එල් අයි රාජපක්ෂ

2. <u>වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යේෂ්ඨ ඡාත්‍ර (Senior Fellow of the PGIM)</u>
   විශේෂඥ වෛද්‍ය ඩී ආර් සී හංවැල්ල
   විශේෂඥ වෛද්‍ය වී ඒ ද සිල්වා

3. <u>වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සම්මානිත ජ්‍යේෂ්ඨ ඡාත්‍ර</u>
   ( Honorary Senior Fellow of the PGIM)
   එම් ඩී ඩී පීරිස් මහතා

4. <u>බාහිර මහාචාර්ය</u> (Visiting Professor of the PGIM)
   මහාචාර්ය ජයන්ත වීරසිංහ
   විශේෂඥ වෛද්‍ය රන්ජනී ගමගේ
   විශේෂඥ වෛද්‍ය ආර් එල් සතරසිංහ

**24 අධ්‍යයන මණ්ඩල මගින් පවත් වන ලද වැඩමුළු**

සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විවිධ අධ්‍යයන මණ්ඩල විසින් වැඩ මුළු පැවැත්වීමට අවශ්‍ය සංවිධාන කටයුතු සිදුකරන ලදී. මෙම වැඩ මුළු ආයතනයේ පූර්ණ හෝ අර්ධ වශයෙන් වූ මූල්‍යාධාර මත සංවිධානය කරන ලදී. ශල්‍ය වෛද්‍යවේද අධ්‍යයන මණ්ඩලය විසින් විශේෂඥ පුහුණු වෛද්‍යවරුන් සඳහා වැඩ මුළුවක් සංවිධානය කරන ලද අතර අභ්‍යාසලාභීන්ගේ මූලික දක්ෂතා වැඩිදියුණු කිරීම පිණිස වන වැඩ මුළුවක් සංවිධානය කරන ලදී. ඊට අමතරව විශේෂඥ පුහුණු වෛද්‍යවරුන් සඳහාද වෙනමම වූ වැඩ මුළුවක් පවත්වන ලදී.

පවුල් සෞඛ්‍ය, අධිකරණ වෛද්‍ය විද්‍යා, ප්‍රජා වෛද්‍ය විද්‍යා යන අධ්‍යයන මණ්ඩල විසින් එම විෂය ක්ෂේත්‍රයන්ට අදාලව පවත්වනු ලබන පුහුණු පාඨමාලාවන්හි විවිධ අංශයන් හා ඇගයුම් ක්‍රම සමාලෝචනයට ලක් කිරීම පිණිසත්, එම පාඨමාලාවන්ට අදාල සංස්ථා ප්‍රකාශන (prospectus) යාවත්කාලීන කිරීම පිණිසත් වැඩමුළු සංවිධානය කරන ලදී.

වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින්ද පශ්චාත් උපාධි පවුල් සෞඛ්‍ය ඩිප්ලෝමා (දුරස්ථ අධ්‍යාපන) පාඨමාලාවට හා විෂ වෛද්‍යවේදය පිළිබඳ විද්‍යාපති (ඔන්ලයින්) පුහුණු පාඨමාලාවට අදාලව වැඩමුළු ගණනාවක්ම පවත්වන ලදී.

## 25 නව විෂය ක්ෂෙත්‍රයන්හි මිනිස් බල අවශ්‍යතා

වෛද්‍ය විෂයට අදාල නව විෂය ක්ෂෙත්‍රයන්හි විශේෂඥ ශ්‍රේණියේ මිනිස් බල අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් නව පාඨමාලා හදුන්වාදීමට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් සැලසුම් කරන ලදී. සාම්ප්‍රදායික පුහුණු පාඨමාලාවන්ට මදක් වෙනස් ආකාරයෙන් විශේෂඥ පුහුණු පාඨමාලාවන් එනම් මාර්ගගත හා දුරස්ථ අධ්‍යාපන මාධ්‍ය මගින් වෛද්‍යවරුන් පුහුණු කිරීමට මෙහිදී වැඩි අවධානයක් යොමු කරන ලදී. මේ සම්බන්ධයෙන් විදේශයන්හි විශිෂ්ඨතා පුහුණු මධ්‍යස්ථාන විසින් හදුන්වාදී ඇති පුහුණු පාඨමාලාවන්ට අනුරූප පාඨමාලාවන් හදුන්වා දීමටත් ඒ සඳහා එම ආයතනයන් වෙතින් විශේෂඥ දැනුම හා දක්ෂතාවන් මෙම ආයතනයේ පාඨමාලාවන්ට එක් කිරීමටත් අපේක්ෂා කරන ලදී. සමාලෝචිත වර්ෂය තුලදී ජීව වෛද්‍ය විඥාපනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව හැදෑරීම සඳහා දෙවන අභ්‍යාසලාභී කණ්ඩායමද බඳවා ගන්නා ලදී. ඊට අමතරව පවුල් වෛද්‍යවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (දුරස්ථ අධ්‍යාපන) පාඨමාලා හැදෑරීම සඳහා 2010 නොවැම්බර් මාසයේදී 31 දෙනෙකුගෙන් සමන්විත අභ්‍යාසලාභීන් කණ්ඩායමක් බඳවා ගන්නා ලදී. මෙම පාඨමාලාවේ ඉගැන්වීම් හා පුහුණු කටයුතු දැනට ක්‍රියාත්මක පවුල් වෛද්‍යවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවට සමගාමීව සිදුකෙරේ. මෙම දුරස්ථ අධ්‍යාපන පාඨමාලාව හදුන්වාදෙන ලද්දේ පාඨමාලා හැදෑරීමට උනන්දුවක් දක්වන එහෙත් සිය ප්‍රතිකාර සේවා හේතුවෙන් අධ්‍යාපන කටයුතු සඳහා කාලය මිඩංගු කිරීමට නොහැකි විශේෂයෙන් පිටපළාත් වල පෞද්ගලික මට්ටමින් ප්‍රතිකාර සේවාවල නියුතු වෛද්‍යවරුන්ගේ යහපත පිණිසය.

## 26 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජාත්‍යන්තර සම්බන්ධතා

භූතාන සහ මාලදිවයින් රාජ්‍යවල සෞඛ්‍ය බලධාරීන් විසින් කරන ලද ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් එම රටවල වෛද්‍යවරුන්හට මෙම ආයතනයේ ප්‍රවේශ පරීක්ෂණවලින් සමත්වීමට හැකිවන අයුරින් නව ආකෘතියක ප්‍රවේශ පරීක්ෂණයක් සැකසීමට ආයතනය කටයුතු ආරම්භ කරන ලදී. මෙම ආයතනය මඟින් පවත්වනු ලබන ප්‍රවේශ පරීක්ෂණයන්ගේ ඉහළ ගුණාත්මක තත්ත්වය හේතුවෙන් අදාල පරීක්ෂණවලින් සමත් වීමට එම දෙරටේ අභ්‍යාසලාභීන්හට දුෂ්කරතා පැනනැඟී තිබීම මෙම තීරණයට එලඹීමට හේතු විය. අනුමත කරගන්නා ලද නව ප්‍රවේශ පරීක්ෂණ ආකෘතියට අනුව අපේක්ෂකයන් විසින් මධ්‍ය විෂයයට (core subjects) අදාල ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකටත්, තමන් විශේෂඥ පුහුණුව ලැබීම සඳහා තෝරා ගනු ලබන විෂය ක්ෂේත්‍රයට අදාල ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකටත් පෙනී සිටිය යුතුවන්නේය. මෙහිලා විශේෂත්වය වන්නේ මෙම ප්‍රවේශ පරීක්ෂණ ඒ ඒ රටවල පැවැත්වීමයි. නව ප්‍රවේශ පරීක්ෂණයෙන් සමත්වන වෛද්‍යවරුන්ද ආයතනය මගින් පවත්වනු ලබන විශේෂඥ පුහුණු පාඨමාලාවන්ට ඇතුළත් වී අනෙකුත් අභ්‍යාසලාභීන් හා පුහුණුව ලැබිය යුතු අතර වෛද්‍ය විශාරද අවසන් පරීක්ෂණය සඳහා අනෙකුත් අභ්‍යාසලාභීන් හා සමඟම පෙනී සිටිය යුතුවන්නේය. අවසන් උපාධි පරීක්ෂණයේ ඇගයීම් ක්‍රියාදාමය අභ්‍යාසලාභීන් සියළුදෙනාටම පොදු වන්නේය. සමාලෝචිත වර්ෂයේ අවසන් භාගයේදී පමණ නව ප්‍රවේශ පරීක්ෂණය භූතාන සහ මාලදිවයින යන රටවලදී පැවැත්වීමට අපේක්ෂා කරන ලදී.

## 27 මැලේසියානු රෝහල්වල හා විශිෂ්ඨතා මධ්‍යස්ථානවල වැඩිදුර පුහුණුව සඳහා අවස්ථා ලබාගැනීම

අනිවාර්ය විදේශ පුහුණුව සඳහා මලයාසියාවේ රෝහල්වල සහ විශිෂ්ඨතා පුහුණු මධ්‍යස්ථානවල පුහුණු අවස්ථා සඳහා අයදුම් කළ අභ්‍යාසලාභීන් කිහිපදෙනෙකුටම රැකියා අවස්ථා මත එම පුහුණුව ලැබීමට හැකි විය. එම පුහුණුව මැලේසියානු පුහුණු ඒකකවලදී එරට විශේෂඥ වෛද්‍යවරුන් යටතේ පුහුණුව ලැබීමට මේ අනුව හැකි විය. විවිධ විශේෂඥ විෂය ක්ෂේත්‍රයන්ගෙන් වැඩිදුර පුහුණු අවස්ථා ලබාදීමටද මලයාසියානු බලධාරීන් එකඟතාවය පලකිරීම මෙහිලා විශේෂයෙන් සඳහන් කළයුතු කරුණකි. එපමණක් නොව මෙම නව ක්‍රමය යටතේ මෙරට වෛද්‍යවරුන්හට මැලේසියානු රෝහල්වල සේවය කිරීමේ අවස්ථාවද උදාවිය. ශ්‍රී ලංකාවේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ දක්ෂතා හා නිපුණතා මෙන්ම ඔවුන්ගේ කාර්ය සාධනයත් එරට සෞඛ්‍ය බලධාරීන්ගේ පැසසුමට ලක්වී තිබීම මෙම තත්ත්වය ඇතිවීමට ඉමහත් රුකුලක් විය.

# 28 පුස්තකාලය

## 28.1 පුස්තකාල එකතුව

**ග්‍රන්ථ එකතුව**

2010 වර්ෂය තුලදී නව ග්‍රන්ථ 398 ක් පුස්තකාලය සඳහා සැපයිණි. ඉන් ග්‍රන්ථ 320 ක්ම මිලදී ගත් ඒවා වූ අතර එහි වටිනාකම රු. 6,380,688/- ක් විය. ඊට අමතරව ග්‍රන්ථ 78ක් පරිත්‍යාග වශයෙන් පුස්තකාලයට ලැබුණු අතර ඒවා ප්‍රතිග්‍රාහක අංක යොදා පුස්තකාලයේ පරිශීලනයට යොදන ලදි. සමාලෝචිත වර්ෂය තුලදී පුස්තකාලය ලද පරිත්‍යාග වල මුළු වටිනාකම රු. 39,000/- ක් විය. මීට අමතර ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් වාර්ථා තුනක් පරිත්‍යාග වශයෙන් ආයතනයට ලබාදෙන ලදී.

**වාර සඟරා**

වාර සඟරා 43 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී මුදල් ගෙවන ලද අතර වාර සඟරා 22 ක් පරිත්‍යාග වශයෙන් පුස්තකාලයට ලැබුණි. මෙම පුස්තකාලය විසින් වාර සඟරා 6ක් පරිත්‍යාග වශයෙන් වෙනත් පුස්තකාලවලට ලබාදෙන ලදී.

**උපාධි ග්‍රන්ථ එකතුව**

සමාලෝචිත වර්ෂය තුලදී පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් විසින් සකසන ලද උපාධි ග්‍රන්ථ 166 ක් පුස්තකාලයේ උපාධි ග්‍රන්ථ එකතුව සඳහා එක් කරන ලදී.

**බහු මාධ්‍ය එකතුව**

පුස්තකාලයේ බහුමාධ්‍ය එකතුවට සංයුක්ත තැටි 61 ක් අළුතින් එකතු කරන ලදි. මෙම වර්ෂය තුලදී සංයුක්ත තැටි 14 ක් පාඨකයින් සඳහා අනු පිටපත් කරන ලද අතර ඉන් රු. 840/- ක මුදලක් ආදායම වශයෙන් ලැබුණි.

පාඨකයින් සඳහා ඡායාරූප 157 ක් විද්‍යුත් ක්‍රමයට පිටපත් කරන ලද අතර ඉන් රු. 3140/- ක මුදලක් ආදායම වශයෙන් ලැබුණි.

**28.2 පුස්තකාල සමාජිකත්වය**

සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍යවරුන් 5555 දෙනෙක් පුස්තකාලය පරිශීලනය කරන ලද අතර අභ්‍යාසලාභීන් 178 දෙනෙකු නව සාමාජිකයන් වශයෙන් ලේඛණ ගත කරන ලදි. ඉන් 05 දෙනෙක් අධ්‍යයන කාර්යමණ්ඩලයට අයත් පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් වූහ. හයදෙනෙක් සිය සාමාජිකත්වය අළුත් කර ගත්හ.

**28.3 පාඨක සේවා**

**අන්තර් පුස්තකාල ණය ක්‍රමය**

සමාලෝචිත වර්ෂය තුළදී ලෝක සෞඛ්‍ය සංවිධානය වෙතින් සඟරා ලිපි 55 ක් හා වෙනත් පුස්තකාල වලින් සඟරා ලිපි 43 ක් ලබාගත් අතර වෙනත් විශ්වවිද්‍යාල පුස්තකාල සඳහා ලිපි 55ක් අන්තර් විශ්වවිද්‍යාලයීය පුස්තකාල ණය ක්‍රමය යටතේ සපයන ලදි.

**පොත් බැඳීම**

2010 වර්ෂය තුලදී ග්‍රන්ථ 79 ක් හා වාර සඟරා 15 ක් බැඳීම සිදුකරන ලදි.

**28.4 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ශාඛා පුස්ථකාලය, පේරාදෙණිය**

1985 වසරේදී ස්ථාපනය කරන ලද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ශාඛා පුස්ථකාලය පේරාදෙණිය ශික්ෂණ රෝහල් පරිශ්‍රයේදී පවත්වාගෙන යනු ලබයි. පේරාදෙණිය සහ මහනුවර ශික්ෂණ රෝහල් වලට අනුබද්ධිතව පුහුණුව ලබන හා සේවය කරනු ලබන අභ්‍යාසලාභීන්ගේ හා වෛද්‍යවරුන්ගේ පුහුණු හා විඥාපන අවශ්‍යතා සපුරාලීම මෙම ශාඛා පුස්ථකාලයේ අරමුණ වේ. මෙම ශාඛා පුස්ථකාලය මධ්‍යම පලාතේ වෛද්‍යවරුන්ගේ ප්‍රධානම අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය බවට පත්ව ඇත.

**පාඨක ගහනය**
2009 වර්ෂයේදී හඳුන්වාදුන් මධ්‍යම සාමාජිකත්ව ක්‍රමය යටතේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලේඛන ගතවී සිටින ඕනෑම වෛද්‍යවරයකු හට රු 1000 ක සාමාජිකත්ව ගාස්තුවක් ගෙවීමෙන් පසු ශාඛා පුස්ථකාලයේ සේවා පරිශීලනය කිරීමට හැකියාව ලැබේ. ආපසු ගෙවනු ලබන රු 10000 ක තැන්පතුවක් ගෙවීමෙන් පසු වෛද්‍යවරුන් හට පොත්පත් ලබාගැනීමේ පහසුව ලබාදී තිබූ අතර එම ගාස්තුව පේරාදණිය ශික්ෂණ රෝහලේ වෛද්‍යවරුන් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු 7500 දක්වා අඩු කරන ලදී. නව ක්‍රමය යටතේ වෛද්‍යවරුන් 105 දෙනෙකු 2010 වර්ෂයේදී පුස්ථකාල සාමාජිකත්වය ලබාගත්හ.

**සම්පත් සංවර්ධනය**
වෛද්‍ය සඟරා
2010 වර්ෂයේදී ශාඛා පුස්ථකාලය වාර සඟරා 15 ක් ලබාගැනීම සඳහා මුදල් ගෙවන ලදී.

ඊට අමතරව 2010 වර්ෂයේදී පහත සඳහන් වාර සඟරා දෙක පරිත්‍යාග වශයෙන් ලැබුනි.

1. British Journal of Urology Internatioanl (මෙය වෛද්‍ය සුජීව තලගස්පිටිය මහතාගේ මැදිහත්වීම මත මහාචාර්ය ජෝන් එම් ෆිට්ස් පැට්‍රික් මහතා විසින් පරිත්‍යාග කරන ලදී)
2. The Lancet (මෙය ඩේසි සෙනෙවිරත්න මහත්මියගේ මැදිහත්වීම මත ඇම්ස්ටඩෑම් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය ෆිලික්ස් ක්‍රෙ මහතා විසින් පරිත්‍යාග කරන ලදී)

ග්‍රන්ථ
2010 වර්ෂයේදී ආයතනය විසින් මිලදී ගනු ලදුව ශාඛා පුස්ථකාලයට ග්‍රන්ථ 145 ලැබීන. පරිත්‍යාගද සහිතව වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ග්‍රන්ථ එකතුව ග්‍රන්ථ 1339 කින් සමන්විත වූ අතර ශික්ෂණ රොහල් ග්‍රන්ථ එකතුව 1107 විය.

සංයුක්ත තැටි/DVD එකතුව

සමාලෝචිත වර්ෂය තුළදී ශාඛා පුස්ථකාලයේ සංයුක්ත තැටි/DVD එකතුව 200 දක්වා වර්ධනය විය.

ශාඛා පුස්ථකාලය විසින් 2010 වර්ෂයේදී සපයන ලද සේවා

- පුස්ථකාලය විසින් ලෙන්ඩින් ඇන්ඩ් රෙෆරන්ස් පහසුකම් සපයන ලදී.
- පරිශීලනය සඳහා සඟරා ද සංයුක්ත තැටි/DVD එකතුවක් ද පාඨකයන් හට සපයන ලදී.
- ග්‍රන්ථ සම්බන්ධයෙන් පාඨකයන්හට දැනගැනීම පිණිස මාර්ගගත පොදු ප්‍රවේශ කැට්ලොග් ක්‍රමය පුස්ථකාලය විසින් පාඨකයන් සඳහා විවෘත කරනලදී. එමෙන්ම ආයතනයේ වෙබ් අඩවිය වන http://www.cmb.ac.lk/pgim/lib/pera/index.php මගින් ද එම තොරතුරු පාඨකයන් හට දැනගැනීමට සලසන ලදී.
- ලේඛන සෙවීම් මුද්‍රණය හා ස්කෑන් කිරීම සඳහා පාඨකයන් හට පරිගණක 4කින් සේවා සපයන ලදී.
- සංයුක්ත තැටි/DVD සකස් කරගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සපයන ලදී.
- ඊට අමතරව ෆැක්ස් පණිවිඩ යැවීම සඳහාත් ඡායාස්ථිති පිටපත් ලබාගැනීම සඳහාත් අවශ්‍ය පහසුකම් සපයන ලදී.
- හෙලිස් ජාලය යටතේ අන්තර් පුස්තකාල ණය සේවා පහසුකම් පරිශීලන පහසුකම් සහ ලේඛන ලබාගැනීම අවශ්‍ය පහසුකම් ද සපයන ලදී.

පත්කිරීම
ජී ආර් සි ටී හේරත් මෙනවිය 2010-04-17 වන දින සිට බලපාන පරිදි කම්කරු සේවයට පත්කරන ලදී.

කාර්යමණ්ඩල සංවර්ධනය
හෙලිස් ජාලය විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ දී 2010 11-08 සිට 2010-11-12 දින දක්වා පවත්වන ලද "WHO HINARI" වැඩමුළුව සඳහා ශාඛා පුස්තකාලයේ සේවයේ නියුතු එච් එන් එල් හේවාගම සහ ජී ආර් සී ටී හේරත් යන මහත්මීහු සහභාගි වූහ.

යෝජිත ආයතන කලාපීය මධ්‍යස්ථානය සඳහා සුදුසු බිම්කඩක් සැපයීම
සමාලෝචිත වර්ෂය තුලදී ආයතන කලාපීය මධ්‍යස්ථානයක් පේරාදෙණිය විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පිහිටුවීම පිණිස සුදුසු බිම්කඩක් ලබාගැනීමේ අරමුණින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ බලධාරීන් සමඟ

සාකච්ඡා පවත්වන ලදී. මෙම ආයතනයේ කලමණාකරණ මණ්ඩලය විසින් පේරාදෙණිය රෝහලේ හා අනෙකුත් රෝහල්වල සේවයේ නියුතු වෛද්‍යවරුන් හට වඩා හොඳ පුස්ථකාල සේවාවක් හා වෙනත් පහසුකම් ලබාදීමේ අරමුණින් මෙලෙස කලාපීය මධ්‍යස්ථානයක් පිහිටුවීමටත් ඒ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාල පරිශ්‍රයෙන් සුදුසු බිම්කඩක් ලබාගැනීමටත් තිරණය කරන ලදී. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කටයුතු පිළිබඳ කමිටුව විසින් මේ සඳහා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා වෙන්කොට ඇති භූමි භාගයෙන් පර්චස් 41 ක ප්‍රමාණයකින් සමන්විත බිම්කඩක් ලබාදීමට හඳුනාගෙන තිබුණි. ඒ සඳහා අවබෝධතා ගිවිසුමක් සකස් කර ගැනීමට අවශ්‍ය සාකච්ඡා 2010 වර්ෂය තුළ දී පවත්වාගෙන යන ලදී.

**29 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අයනනය විසින් පවත්වන ලද පරීක්ෂණයන්ට අදාල පසුගිය වර්ෂවල ප්‍රශ්ණ පත්‍ර පිටපත් අලෙවිය**

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් පවත්වන ලද විභාගයන්ට අදාල ප්‍රශ්ණ පත්‍ර මුද්‍රිත මාධ්‍යයෙන් සහ සංයුක්ත තැටි වශයෙන් ලබා ගැනීමට මෙම වර්ෂය තුලදී ද අභාසලාභීන්හට පහසුකම් සපයන ලදි.

2010 වර්ෂය තුළ දී පුස්ථකාලයට ලැබුනු නව වාර සඟරා පිළිබඳ විස්තර සමාලෝචිත වර්ෂය තුළ දී අධ්‍යයන මණ්ඩල සභාපතිවරුන් සහ ලේකම්වරුන් මෙන් ම සාමාජිකභවතුන් හට ද SDCP ක්‍රමය යටතේ ලබාදෙන ලදී.

**අනුස්ථාපන වැඩසටහන**
ප්‍රජා වෛද්‍ය විද්‍යා විද්‍යාපති පාඨමාලාව හැදෑරීම සඳහා අභ්‍යාසලාභීන් ලෙස ලේඛනගත වී සිය අධ්‍යයන කටයුතු ඇරඹීම සඳහා පුස්තකාල සාමාජිකත්වය ලබාගත් වෛද්‍යවරුන්හට 2010 ජනවාරි මස 08 වන දින දී අනුස්ථාපන වැඩසටහනක් පවත්වන ලදී.

**ප්‍රකාශන**

1. "Medical Orations and Presidential Addresses from 1990 January to 2009 January" යන ප්‍රකාශනය 2010 වර්ෂය තුල දී පුස්තකාලය විසින් එළි දක්වන ලදී.
2. මැයෙන් සංගෘහිත තැටියක් 2010 වර්ෂයේදී පරිශීලනය සඳහා පුස්තකාලය විසින් සකස් කරන ලදී.

**කාර්යමණ්ඩල සංවර්ධනය**

- පුස්තකාල සහකාර I ශ්‍රේණියේ නිලධාරිනියක වූ ඩබ්.ඩී.අයි.පී. දිසානායක මහත්මිය 2010 ජනවාරි 01 දින සිට බලපාන පරිදි මාණ්ඩලික සහකාරවරියක් වශයෙන් උසස් කරන ලදී.

- මෙම ආයතනයේ සහකාර පුස්තකාලයාධිපතිනී පී.පී.ඩී. මුණසිංහ මහත්මිය "Research Methods for Development Planning and Management" මැයෙන් කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත කොළඹ විශ්ව විද්‍යාලයීය ප්‍රජා ව්‍යාප්ති මධ්‍යස්ථානය විසින් පවත්වන ලද සහතිකපත්‍ර පාඨමාලාවට සහභාගි වූවාය.

- පේරාදෙණිය ශාඛා පුස්ථකාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනී ඩේසි සෙනෙවිරත්න මහත්මිය සහ මෙම ආයතනයේ සහකාර පුස්තකාලයාධිපතිනී පී.පී.ඩී. මුණසිංහ මහත්මිය විශ්වවිද්‍යාලීය පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය විසින් සංවිධානය කරනු ලදුව 2010 ජූලි 14, 15 යන දෙදිනදී කොළඹ 'Ceylon continental' හෝටලයේදී "University Librarianship: an academic challenge and opportunity" මැයෙන් පැවැත් වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සහභාගි වූහ.

- මෙම ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනී ටී ශ්‍රීධරන් මහත්මිය හා සහකාර පුස්තකාලයාධිපතිනී පී.පී.ඩී. මුණසිංහ මහත්මිය ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සංවිධානය කරනු ලදුව කොළඹ විශ්ව විද්‍යාලයීය ප්‍රධාන පුස්තකාල ශාලාවේදී "Health Inter Network access to Research Initiatives (HINARI) and Development of Institutional Repository" මැයෙන් වු වැඩමුළුව සඳහා සහභාගි වූහ.

**30 වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය**

2010 වර්ෂය, වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයට කාර්ය බහුල මෙන්ම ඵලදායී වර්ෂයක් වීය. එමෙන්ම ආයතනය විසින් ඉටුකරන ලද බොහෝ කටයුතු වලදී වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය මූලික කාර්යභාරයක් ඉටුකලේය. වෛද්‍ය පණ්ඩුල සිරිබද්දන මහතා 2010 වර්ෂය තුළදීද එම මධ්‍යස්ථානය විසින් ඉටුකල ශාස්ත්‍රීය කටයුතු සංවිධානය කිරීමෙහි ලා මහඟු කාර්යභාරයක් ඉටුකලේය.

පූර්ව සීමාවාසික ප්‍රදර්ශකවරුන් වශයෙන් 2009 වර්ෂයේ දී සම්පත් මධ්‍යස්ථානයට සම්බන්ධවූ වෛද්‍ය නලින් ධර්මරත්න, ධනන්ජා රූබසිංහ, සචන් ද සිල්වා සහ සංලක්ෂි ලියනගම යන වෛද්‍යවරුන් 2010 මැයි මසදී සීමාවාසික පත්වීම් ලැබ මධ්‍යස්ථානයෙන් නික්ම ගියහ. ඒ වෙනුවට වෛද්‍ය දිලිනිකා වන්නිආරච්චි, වෛද්‍ය ෆදීමා රහිනා හෂීම්, වෛද්‍ය උදේශිනී සෝමසිරි, වෛද්‍ය මාධව ජීවන්ත සහ වෛද්‍ය ටම්ශ්ක ඇරැපොල යන වෛද්‍යයවරු පූර්ව සීමාවාසික ප්‍රදර්ශකවරුන් වශයෙන් මධ්‍යස්ථානයට එකතු වූහ.
ඩි. ඩී. ඉ. දසනායක මෙනවිය පරිගණක යෙදවුම් සහකාරවරිය වශයෙන් ද ජී මඩවල මෙනවිය නයිටා පුහුණු කරුවකු ලෙසද තව දුරටත් සේවයේ නියැලුනු අතර ටී. ජේ. තිලිනි නදීශා මෙනවිය නයිටා පුහුණු කාරියක ලෙස 2010 වසරේ අවසන් භාගයේදී මධ්‍යස්ථනයට සම්බන්ද විය. 2010 ජූලි මාසයේදී වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය පරිගණක යෙදවුම් සහකාරවරියක වශයෙන් සේවය කරමින් සිටි උපමාලි විජේරත්න මහත්මිය තනතුරින් ඉල්ලා අස්වූවාය.

වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය පෙර පරිදිම ආයතනයේ පුවත් පත්‍රිකාව සැලසුම්කොට මුද්‍රණද්වාරයෙන් එලිදැක්වීමට කටයුතු කලේය. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මෙම වර්ෂයේදීද පුවත් පත්‍රිකාව එලිදැක්වීමේ කටයුතුවල නිමග්න වූ අතර 2010 වර්ෂයේ දී පුවත් පත්‍රිකාවේ වෙළුම් හතරක් එලිදැක්වීමට කටයුතු කලේය.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් දැනටමත් හඳුන්වාදී තිබූ ප්‍රකාශනයන්ට අමතරව ආයතනය විසින් සිය පුවත් පත්‍රිකාව වෙළුම් හතරක් මෙම වර්ෂයේදී එලිදැක්වීමට කටයුතු කලේය.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පුහුණුව සඳහා හඳුන්වාදී ඇති පුහුණු පාඨමාලාවන්ට අමතර වශයෙන් නව පාඨමාලා හඳුන්වාදීම පිණිස විශේෂඥ ක්ෂේත්‍ර මණ්ඩල බහු විෂය ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලය සහ මූලික සහ වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන මණ්ඩලය විසින් ඉටුකරනු ලබන කාර්යන් සම්බන්ධිකරණය කිරීමේලා උත්සුක විය. විෂ වෛද්‍යවේදය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව නවතම වූ මාර්ගගත පාඨමාලාවක් ලෙසින් හඳුන්වාදීමට 2010 වර්ෂයේදී ආයතනයට හැකි විය. මෙම පාඨමාලාව මාර්ගගත දුරස්ථ අධ්‍යාපන පාඨමාලාවක් ලෙසින් moodle ඉගැනුම් කළමණාකරණ පද්ධතිය භාවිතයෙන් කරගෙන යන්නක් විය. පාඨමාලා ඉගෙනුම් කටයුතුවලට අමතරව සායනික ලේඛන අඩංගු කොට 'ලේඛන සංග්‍රහයක්' සැකසීම අභ්‍යාසලාභින් වෙතින් අපේක්ෂා කරනලදී. සමාලෝචිත වර්ෂය තුළදී අභ්‍යාසලාභීන් 35 දෙනෙකුගෙන් සමන්විත පළමුවන කණ්ඩායමට අදාල ඉගෙනුම් කටයුතු ඉටුකරන ලදී.

සංඝඨක සත්කාර වෛද්‍යවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු කණ්ඩායමේ අභ්‍යාසලාභින්ගේ අවසන් පරීක්ෂණය මාර්තු 21 දින සිට 26 දින දක්වා පවත්වන ලදී. පළමු කණ්ඩායමට අයත් අභ්‍යාසලාභින්ගේ 23 දෙනකු ගෙන් සමන්විත අභ්‍යාසලාභින් කණ්ඩායම ඔවුන්ගේ අවසන් පරීක්ෂණය සාර්ථකව අවසන් කළ අතර ඔවුන් සෞඛ්‍ය අමාත්‍යංශයට මුදාහැරීමද සිදුකරන ලදී. සංඝඨක සත්කාර වෛද්‍යවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා වන දෙවන කණ්ඩායම තෝරාගැනීමේ පරීක්ෂණය 2010 වර්ෂ අවසානයේදී පවත්වන ලදී. පාඨමාලාවේ කටයුතු 2011 වර්ෂයේදී පැවැත්වීමට අපේක්ෂා කරන ලදී.

පශ්චාත් උපාධි පවුල් වෛද්‍ය මාර්ගගත ඩිප්ලෝමා පාඨමාලාවේ අභ්‍යාසලාභින් 2010 නොවැම්බර් මස පැවති සිය අවසන් පරීක්ෂණයට පෙනී සිටියහ. එම පාඨමාලාව සඳහා වන දෙවන කණ්ඩායමද 2010 නොවැම්බර් මසදී සිය අධ්‍යාපන කටයුතු ආරම්භ කලහ. නව අභ්‍යාසලාභින් කණ්ඩායම සඳහා සමාරම්භක හා අනුස්ථාපන සැසි 2010 නොවැම්බර් මස 20 වන දින පවත්වන ලදී. ඊට අමතරව වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් වැඩමුළු ගණනාවක්ම පවත්වන ලදී. පශ්චාත් උපාධි පවුල් වෛද්‍ය ඩිප්ලෝමා පාඨමාලාවට අදාල උපදේශකවරු (Mentors) පුහුණු කිරීම සඳහා ද සම්පත් මධ්‍යස්ථානය විසින් වැඩමුළු ගණනාවක් ම පවත් වන ලදී.

වෛද්‍ය අධ්‍යාපනය පිළිබද පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාවට අදාල අධ්‍යාපන කටයුතු 2010 පෙබරවාරි මස 13 දින ආරම්භ කරන ලදී. මෙය අර්ධකාලීන පාඨමාලාවක් වන අතර මාස 6 පාඨමාලා කාලයකින් සමන්විත විය. 2010 ජුනි මාසයේ දී වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යාපන කටයුතු ආරම්භ කරන ලදී. වෛද්‍ය අධ්‍යාපනය පිළිබද විශේෂඥ ක්ෂේත්‍ර

මණ්ඩලය විසින් වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ වෛද්‍ය විශාරද පුහුණු පාඨමාලාවක් සැලසුම් කිරීමේ කටයුතු වල නිරත විය.

අණුක වෛද්‍යවේදය පිළිබඳ විද්‍යාපති පාඨමාලාවට ලේඛණ ගතවූ අභ්‍යාසලාභීන් සඳහා දේශන, බහු විෂය ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයේ මගපෙන්වීම යටතේ කරගෙන යන ලදී. එම අභ්‍යාසලාභීහු ඊළඟ අදියර වන පර්යේෂණ ව්‍යාපෘතිය නිම කිරීමේ කටයුතු වල නියැලිණි. වසර දෙකක පාඨමාලාවක් වන ජීව වෛද්‍ය විඥාපනය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව නෝමා ව්‍යාපාතියේ මූල්‍යමය ආධාර මත කරගෙනයනු ලබන්නකි. 30 දෙනෙකු ගෙන් සමන්විත වන එහි පළමු කණ්ඩායම සිය ශාස්ත්‍රීය කටයුතු 2010 වසරේදී ආරම්භ කරන ලද අතර සිය දේශන කටයුතු නිමවීමෙන් පසුව ව්‍යාපෘතියට අදාල පර්යේෂණ කටයුතු වල නිරත වෙමින් සිටියහ. 2010 වර්ෂය තුල දී 30 දෙනෙකුගෙන් සමන් විත මෙම පාඨමාලාවේ දෙවන කන්ඩායමද සිය අධ්‍යයන කටයුතු ආරම්භ කළහ. ඊට අමතරව ජීව වෛද්‍ය විඥාපනය පිළිබඳ ශ්‍රී ලංකා සඟරාව පලකිරීම 2010 වර්ෂය තුළ දී සිදුකරන ලදී.

2010 වර්ෂයේදී නෝමා ව්‍යාපෘතිය විසින් 'Sri Lanka e-health' මැයෙන් සිම්පෝසියාවක් ද පවත්වන ලදී.

සායනික භිෂග්වේදය පිළිබඳ වෛද්‍ය විශාරද උපාධි පාඨමාලාව, ව්‍යසන පෙර සූදානම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව, වයෝවෘද්ධයන් පිළිබඳ කායික වෛද්‍යවේදය, භෞතවේදය සහ කාය ව්‍යවච්ඡේදනය පිළිබඳ ඩිප්ලෝමා යන පාඨමාලාවන් හඳුන්වාදීම පිණිස එම පාඨමාලාවන්ට අදාල විෂයමාලා සංවර්ධන කටයුතු 2010 වර්ෂයේදී ඉටුකෙරිණ. සායනික භිෂග්වේදය පිළිබඳ විශේෂඥවරයකු වශයෙන් ස්වාධීනව හා ඵලදායී ආකාරයෙන් කටයුතු කළ හැකි අපේක්ෂිත මට්ටමේ දැනුමකින් හා දක්ෂතා ආකල්ප හා නිපුණතාවයෙන් පිරිපුන් කායික වෛද්‍යවරයකු බිහි කිරීම සායනික භිසග්වේදය සහ චිකිත්සාව පිළිබඳ වෛද්‍ය විශාරද පාඨමාලාවේ මූලිකම අරමුණ වන්නේය. සායනික භිෂග්වේදය පිළිබඳ විශේෂඥවරයකු වශයෙන් මාණ්ඩලික සහතිකය පිරිනැමීම පිණිස වෛද්‍ය විශාරද (කායික වෛද්‍යවේදය) උපාධිය ලැබීමෙන් අනතුරුව අභ්‍යාසලාභියකු විසින් තෙවසරක වැඩිදුර පුහුණුව ලැබිය යුතු වේ.

ව්‍යසන පෙර සූදානම සහ සෞඛ්‍යාරක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව වර්ෂයක පුහුණු කාලසීමාවකින් යුක්ත වන අතර මාස හතක පූර්ණ කාලීන සායනික පුහුණුවකින් ද සමන්විත වේ. මෙම පාඨමාලාව හදාරන අභ්‍යාසලාභීන් ව්‍යසන හේතුවෙන් අවතැන් වන පුද්ගලයන්ගේ සෞඛ්‍යාරක්ෂණ අවශ්‍යතාවන් වන සුවපත් කිරීම්, රෝග වැලැක්වීම් සහ පුණරුත්ථාපන යන ක්ෂේත්‍රයන් යටතේ වටමාරු පදනමකින් (Rotation Basis) පුහුණු කටයුතු සඳහා යොමුකෙරේ. වයෝවෘද්ධයන්ගේ සෞඛ්‍ය ආරක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හඳුන්වාදීමට සැලසුම්කොට ඇති අතර එම පාඨමාලාවද පූර්ණකාලීන වසරක පුහුණු කාලයකින් යුක්තවේ. මෙම පාඨමාලාව දේශන, සායනික පුහුණු සහ වෙනත් ඉගැන්වීම් සහ ඉගැනුම් ශිල්පීය ක්‍රම වලින් සමන්විතවේ. මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වන්නේද වයෝවෘද්ධයන්ගේ සෞඛ්‍ය ආරක්ෂණය පිළිබඳ අවශ්‍යතා හඳුනාගෙන ඒවාට ප්‍රතිකාර කිරීමට සමත් වෛද්‍යවරුන් බිහිකිරීමය.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සිව්වන ශාස්ත්‍රීය දේශනය සහ ගරුනාම ප්‍රදානෝත්සවය ඇතුළු ආයතනයේ වාර්ෂික වැඩසටහන් මාලාවේ ප්‍රමුඛ අංග කිහිපයක් සංවිධානය කිරීමේ මූලික වගකීම වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් 2010 වසරේ දී ඉටුකරන ලදී. ශාස්ත්‍රීය දේශනය හා ගරුනාම ප්‍රදානෝත්සවය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විද්වත් සංසදයේද සහය සහිතව සම්පත් මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලදුව 2010 ඔක්තෝබර් මස 14 වන දින දී ආයතන ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

"How to Get your Research published" මැයෙන් 2010 මාර්තු සහ අගෝස්තු යන මාස වලදී වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් වැඩමුළු දෙකක් පවත්වන ලදී. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් හඳුන්වා දී ඇති පුහුණු පාඨමාලාවන් සියල්ලේම පාහේ පුහුණුව ලබන අභ්‍යාසලාභීන් මෙම වැඩමුළු සඳහා සහභාගිවීමටත්, ඒ සඳහා ලේඛන ගතවීමටත් දැක්වූ උනන්දුව සහ අභිලාෂය මෙම වැඩමුළු දෙකෙහි සාර්ථකත්වය මැනවින් විදහාපාන්නක් විය. මෙම වැඩමුළු සඳහා පර්යේෂණ ප්‍රතිඵල ලේඛනගත කිරීම හා සන්නිවේදන දක්ෂතාවන් පිළිබඳව හසල දැනුමක් ඇති විද්වත් පිරිසක් සම්පත් දායකයින් වශයෙන් කටයුතු කලහ.

සමාලෝචිත වර්ෂය තුලදී වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය පර්යේෂණ කටයුතු කරගෙනයාමෙහිලා ද ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරන ලද අතර එම පර්යේෂණ කාර්යයන්හි ප්‍රතිඵල 2010 පෙබරවාරි 4 සිට 8 දක්වා කාලය තුල සිංගප්පූරුවේ ජාතික විශ්වවිද්‍යාලයේදී පැවැත්වූ ආසියානු සහ ශාන්තිකර කලාපීය වෛද්‍ය අධ්‍යාපන සම්මන්ත්‍රණයේදී එළිදක්වන ලදී. ආයතනයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රිස්වි ෂෙරිෆ් සහ ආයතනයේ වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ කථිකාචාර්ය වෛද්‍ය පණ්ඩුල සිරිබද්දන යන මහත්වරුන් ද

පූර්ව සිමාවාසික ප්‍රදර්ශකවරුන් වන වෛද්‍ය ධනන්ජා රූබසිංහ සහ සන්ලක්ෂි ලියනගම යන වෛද්‍යවරුන් ද මෙම සම්මන්ත්‍රණයට සහභාගී වූහ.

## 31 කාර්ය මණ්ඩලය

### 31.1 අනුමත සේවක සංඛ්‍යාව

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා 2010 වසරට අනුමත සේවක සංඛ්‍යාව 120 ක් විය. ඉන් තනතුරු 24 ක් පුරප්පාඩු වී පැවතිණි.

### 31.2 පත්කිරීම්

සමාලෝචිත වර්ෂය තුලදී පහත සඳහන් බඳවා ගැනීම් සිදු කරන ලදි.

| නම | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|
| ටී ශ්‍රීදරන් මහත්මිය | ජ්‍යේෂ්ඨ සහකාර පුස්ථකාලයාධිපතිනි | 2010-07-27 |
| ඒ ඒ එස් පී අමරසිහ මයා | පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණිය | 2010-07-01 |
| ඩී ආර් ගුණරත්න මහතා | පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණිය | 2010-07-01 |
| එක් ලලිත් සංජීව මයා | රියැදුරු (තාවකාලික) | 2010-05-03 |
| ජී ආර් සී ටී හේරත් මහත්මිය | කම්කරු (කොන්ත්‍රාත් පදනම) | 2010-05-17 |
| ඔම් ඩී කසුන් රංග ඔහතා | කම්කරු (කොන්ත්‍රාත් පදනම) | 2010-05-03 |

### 31.3 කාර්යමණ්ඩල සංවර්ධනය

සමාලෝචිත වර්ෂය තුළදී පහත නම් සඳහන් නිලධාරීන් හා සේවක භවතුන් මානව සම්පත් සංවර්ධනය අරමුණුකොට පැවැත් වූ ශාස්ත්‍රිය කටයුතු සඳහා සහභාගී විය

| | | |
|---|---|---|
| ජ්‍යේෂ්ඨ මහාචාර්ය රිස්වි ෂෙරිෆ් මහතා, අධ්‍යක්ෂ | ගණකාධිකරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍යමය වාර්ථා සැපයීම | නිපුණතා සංවර්ධන අරමුදල |
| එම්. පී. පී. දිල්හානි මහත්මිය | සංවර්ධනය සැලසුම්කිරීම හා කළමණාකරණය පිළිබඳ පර්යේෂණ ක්‍රම මැයෙන් වූ සහතිකපත්‍ර පාඨමාලාව | කොලඹ විශ්වවිද්‍යාලයීය ප්‍රජා ව්‍යාප්ති මධ්‍යස්ථානය |
| | සංවර්ධනය සැලසුම්කිරීම හා කළමණාකරණය පිළිබඳ පර්යේෂණ ක්‍රම මැයෙන් වූ සහතිකපත්‍ර පාඨමාලාව | කොලඹ විශ්වවිද්‍යාලයීය ප්‍රජා ව්‍යාප්ති මධ්‍යස්ථානය |
| | විශ්වවිද්‍යාලීය පුස්ථකාලයාධිපති ධුරයඃ ශාස්ත්‍රීය අභියෝගය හා අවස්ථාව මැයෙන් වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | විශ්වවිද්‍යාලයීය පුස්ථකාලයාධිපතිවරුන්ගේ සංගමය |
| | වීඥාපන විද්‍යා පර්යේෂණ සිම්පෝසියාව - 2010 | කැළණිය වශ්වවිද්‍යාලය |
| ඒ. තංගරාජා මහතා | ගණකාධිකරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍යමය වාර්ථා සැපයීම | නිපුණතා සංවර්ධන අරමුදල |
| ඊ. පි. අයි. ප්‍රේමරත්න මෙනවිය | විධිමත් විනය කලමණාකරණය මගින් මානව සම්පත් සංවර්ධනය මැයෙන් වූ සම්මන්ත්‍රණය | විනයානුකූල කලමණාකරණය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය |
| ජී.එම්.වයි.දන්නන්ගොඩ මෙනවිය | වීධිමත් විනයානුකූල කලමණාකරණය මගින් මානව සම්පත් සංවර්ධනය මැයෙන් වූ සම්මන්ත්‍රණය | විනයානුකූල කලමණාකරණය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය |
| ජී. සී. පී. ප්‍රනාන්දු මෙනවිය | ගණකාධිකරණ ප්‍රමිතින්ට | නිපුණතා සංවර්ධන අරමුදල |

| | | |
|---|---|---|
| | අනුකූලව මූල්‍යමය වාර්ථා සැපයීම | |
| කේ. ඒ. එස්. ධර්මසිරි මහතා | කළමණාකරණ සහකාරවරුන් සහ ලිපිකාර ශ්‍රේණිවල නිලධාරීන් සඳහා පැවැත් වූ විඥාපන හා කාර්යාලීය නිපුණතා පිළිබඳ පාඨමාලාව | |
| ආර්. ඒ. චන්ද්‍රදාස මහතා | කළමණාකරණ සහකාරවරුන් සහ ලිපිකාර ශ්‍රේණිවල නිලධාරීන් සඳහා පැවැත් වූ විඥාපන හා කාර්යාලීය නිපුණතා පිළිබඳ පාඨමාලාව | |
| | වාණිජමය වශයෙන් වායුසමීකරණය අධිශීතකරණ පද්ධති හා බලශක්ති ඉතිරිකිරීම් මැයෙන් වූ දෙදින පුහුණු වැඩසටහන් | |
| | විද්‍යුත් පරිපථ ස්ථාපනය හා නඩත්තුව පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන | |
| එම්. බී. රණතුංග මයා | මිලදීගැනීම් හා ඉන්වෙන්ට්‍රි පාලනය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන | ඉන්ඩස්ට්‍රියල් ටෙක්නො මැනේජ්මන්ට් පුද්ගලික ආයතනය |
| ආර්. ඒ. කේ. දිනුරුක්ෂණ මයා | කළමණාකරණ සහකාරවරුන් සහ ලිපිකාර ශ්‍රේණිවල නිලධාරීන් සඳහා පැවැත් වූ විඥාපන හා කාර්යාලීය නිපුණතා පිළිබඳ පාඨමාලාව | |
| | වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි ව්‍යාප්ති පාඨමාලාව | කොළඹ විශ්වවිද්‍යාලය |
| ආර්.ඩබ්.එම්.අයි.එම්. රාජපක්ෂ මහත්මිය | කළමණාකරණ සහකාරවරුන් සහ ලිපිකාර ශ්‍රේණිවල නිලධාරීන් සඳහා පැවැත් වූ විඥාපන හා කාර්යාලීය නිපුණතා පිළිබඳ පාඨමාලාව | කොළඹ විශ්වවිද්‍යාලය |
| ඩබ්. අයි. එන්. සිල්වා මහත්මිය | ඉංග්‍රීසි ප්‍රවිණතා පාඨමාලාව | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය |
| ජී. ඩී. එස්. ගමනායක මහත්මිය | ඉංග්‍රීසි ප්‍රවිණතා පාඨමාලාව | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය |
| එන්. පී. පී. පල්ලියගුරු මහත්මිය | ඉංග්‍රීසි ප්‍රවිණතා පාඨමාලාව | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය |
| ඩී.ඒ.එස්.එස්.සූරියාරච්චි මහත්මිය | ඉංග්‍රීසි ප්‍රවිණතා පාඨමාලාව | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය |
| කේ.ඩබ්.ඩී.අයි.එස්. විජේසේකර මෙනවිය | ඉංග්‍රීසි ප්‍රවිණතා පාඨමාලාව | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය |
| සී.ටී.ඒ.එම්. පෙරේරා මයා | ඉංග්‍රීසි ප්‍රවිණතා පාඨමාලාව | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය |
| එම්. ඒ. වී. ජී. පෙරේරා මයා | රියැදුරන් සඳහා වූ වැඩමුළුව | ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| ආර්. අයි. බුලත්සිංහල මයා | රියැදුරන් සඳහා වූ වැඩමුළුව | ඉදිකිරීම් උපකරණ පුහුණු |

| | | |
|---|---|---|
| | | මධ්‍යස්ථානය |
| එම්. ජේ. නානායක්කාර මයා | රියැදුරන් සඳහා වූ වැඩමුළුව | ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| කේ. ලලිත් සංජීව මයා | රියැදුරන් සඳහා වූ වැඩමුළුව | ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| එම්. ඒ. නාමසිරි මයා | ඩීසල් විදුලි උත්පාදන යන්ත්‍ර පිළිබඳ වැඩිදුර පුහුණු එක්දින සැසිය | ඉන්ඩස්ට්‍රියල් ටෙක්නො මැනේජ්මන්ට් පුද්ගලික ආයතනය |

### 31.4 වැඩපැවරුම් පදනම මත සේවා ලබා ගැනීම්

| නම | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|
| බි. ජී. චන්ද්‍රදාස මහතා | නියෝජ්‍ය ලේඛකාධිකාරී | 2010-03-03 |
| ඒ. තංගරාජා මහතා | නියෝජ්‍ය භාණ්ඩාගාරික | 2009-04-02 |
| එම්.ඒ.එල්. දළුවත්ත මහත්මිය | ලිපිකරු | 2010-07-01 |
| පී. සී. අලහකෝන් මහත්මිය | ලඝුලේඛිකා (ඉංග්‍රීසි) | 2010-07-28 |
| කේ. යූ. අබේනාත් මහතා | පුස්ථකාල සහායක | 2010-10-11 |

### 31.5 ස්ථාන මාරු

| නම | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|
| එච්. ඒ. සතාර් මහතා | නියෝජ්‍ය ලේඛකාධිකාරී | 2010-12-01 |
| ජී.ඩබ්.එල්.ප්‍රියන්තිකා මහත්මිය | ජ්‍යේෂ්ඨ මාණ්ඩලික සහකාර (ලිපිකරු සේවා) | 2010-07-05 |

### 31.6 උසස්වීම්

| නම | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|
| ජී.ඩබ්.එල්.ප්‍රියන්තිකා මහත්මිය | ජ්‍යේෂ්ඨ මාණ්ඩලික සහකාර (ලිපිකරු සේවා) | 2010-01-01 |
| පී. රාජපතිරණ මහත්මිය | ජ්‍යේෂ්ඨ මාණ්ඩලික සහකාර (ලිපිකරු සේවා) | 2010-01-01 |
| ආර්. ආර්. පී. අමරසේන මහත්මිය | ජ්‍යේෂ්ඨ මාණ්ඩලික සහකාර (ලිපිකරු සේවා) | 2010-01-01 |
| ඩබ්. අයි. එන්. සිල්වා මහත්මිය | ජ්‍යේෂ්ඨ මාණ්ඩලික සහකාර (ලිපිකරු සේවා) | 2010-01-01 |
| ඩබ්. ඩී. අයි. පී. දිසානායක මහත්මිය | ජ්‍යේෂ්ඨ මාණ්ඩලික සහකාර (ලිපිකරු සේවා) | 2010-01-01 |
| එච්. ඒ. සිසිර කුමාර මයා | කම්කරු (විශේෂ ශ්‍රේණිය) | 2010-01-01 |
| ඒ. ආර්. එම්. ෆයිසාල් මහතා | ලිපිකරු I ශ්‍රේණිය | 2010-01-01 |

### 31.7 සේවය දීර්ඝ කිරීම්

| නම | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|
| ඩබ්. ඒ. ටී. සී. ඩී. චන්ද්‍රකාන්ති මහත්මිය | ජ්‍යේෂ්ඨ මාණ්ඩලික සහකාර (පුස්ථකාල සේවා) | 2010-11-25 |
| කේ. කේ.එල්. ප්‍රේමතිලක මහතා | බයිසිකල් පණිවුඩකරු (විශේෂ ශ්‍රේණිය) | 2010-09-12 |
| පී. සී. අලහකෝන් මහත්මිය | ලඝු ලේඛිකා I ශ්‍රේණිය | 2009-07-24 |
| කේ. යූ. අබේනාත් මහතා | පුස්ථකාල සහායක | 2009-03-31 |
| කේ. කේ. එල්. ප්‍රේමතිලක මහතා | බයිසිකල් පණිවුඩකරු (විශේෂ ශ්‍රේණිය) | 2009-09-12 |

31.8 විදේශ නිවාඩු

| නම | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රිස්වි ෂෙරිෆ් මහතා | අධ්‍යක ෂ වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | |
| වෛද්‍ය පී. ඒ. සිරිබද්දන මහතා | කථිකාචාර්ය (පරිවාස), වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය | 2010-02-05 සිට 2010-02-09 |
| ජී. එම්. වයි. දන්නන්ගොඩ මෙනෙවිය | සහකාර ලේඛකාධිකාරී | 2010-06-13 සිට 2010-06-27 |

31.9 සේවයෙන් ඉල්ලා අස්වීම්

| | | |
|---|---|---|
| කේ. පී. පද්මා මිය | ලසුලේඛිකා (ඉංග්‍රීසි) | 2010-05-16 |
| ඩබ්.යූ.එම්.එස්.විජේරත්න මිය | පරිගණක යෙදවුම් සහකාර | 2010-11-01 |

32 මූල්‍ය කටයුතු

32.1 විශේෂිත ගණකාධිකරණ ප්‍රතිපත්ති

සාමාන්‍ය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම යටතේ පිළිගත් ගණකාධිකරණ න්‍යායයන්ට හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව ස්ථාවර පදනමක් යටතේ පිළියෙල කර ඇත. හඳුනාගත් බැරකම් සියල්ල සඳහා ප්‍රතිපාදන සපයා ඇත.

හඳුනාගත් සියළුම බැරකම් සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

32.2 වත්කම් සහ ඒවායේ වටිනාකම් පදනම

ඉඩම් ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ ක්ෂයවීම්

එකතු වූ ක්ෂය පිරිවැය මගින් අඩුකිරීම ආකාරයෙන් දෘෂ්‍ය වත්කම් දක්වා ඇත. සරල මාර්ග ක්‍රමය යටතේ පහත සඳහන් ප්‍රමාණයන්ට අනුකූලව ක්ෂයවීම් වාර්ෂිකව අඩු කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 10% |
| රසායණාගාර සහ ඉගැන්වීම් උපකරණ | 20% |
| පුස්තකාල පොත් | 20% |
| මෝටර් රථ | 20% |
| උපාධි ලෝගු | 20% |
| විදුලිය බෙදා හැරීම් | 10% |

නිකුත් කල දින සිට අදාල වනසේ ක්ෂයවීම් දක්වා ඇත. වත්කම් හිමිකාරත්වයෙන් බැහැර කළ සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂයවීම් ගණනය කොට ඇත.

තොග
පෙර ගැණුම් පෙර නිකුතු ක්‍රමය යටතේ තොග වත්කම් දක්වා තිබුණි.

32.3 ලැබීම්

පොලී ලැබීම්
පොලී ලැබීම් ශේෂපත්‍රයේ දක්වා ඇති දිනට එක් එක් බැංකුව මගින් තහවුරු කර ඇති පොලී ප්‍රමාණයන් අනුව ගණනය කොට ඇත.

32.4 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

සේවකයින් සේවයට බැඳුණු මුල් වර්ෂයේ සිට බල පවත්වන පරිදි විශ්‍රාම පාරිතෝෂික දීමනාව සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී. අදාල ප්‍රතිපාදන සඳහා බාහිර වශයෙන් මුදල් සැපයුමක් කොට නොමැත.

32.5 ආයෝජන

**කාර්යමණ්ඩල ආරක්ෂණ තැන්පතු**

කාර්යමණ්ඩල සාමාජිකයන් විසින් කර තිබූ ආරක්ෂණ තැන්පතු ආයතනයේ ඉතිරිකිරීම් ගිණුමෙහි තැන්පත් කොට තිබුණි.

**ත්‍යාග හා මුද්‍රිකා සඳහා වන අරමුදල්**

අභ්‍යාසලාභීන් සඳහා පිරිනැමීමට පිහිටුවා ඇති ත්‍යාග හා මුද්‍රිකා වෙනුවෙන් ආයතනයට ලබා දී ඇති අරමුදල් ස්ථාවර තැන්පතු වල තැන්පත් කොට තිබුණි.

විවිධ අරමුණු වෙනුවෙන් ආයතනයට ලැබී ඇති අරමුදල් ශේෂයන් ද කෙටි කාලීන තැන්පතු සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කොට ඇත. කෙටි කාලීන තැන්පතු සහ ස්ථාවර තැන්පතු කල්පිරීමේදී අදාල පොලියත් සමඟම නැවතත් එම තැන්පතුවලම යළි තැන්පත් කිරීමට උපදෙස් දී ඇත. අදාල අරමුදල් මාස තුන, මාස හය සහ වාර්ෂික යන කාල පරාස සඳහා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කොට ඇත.

**රජයේ අරමුදල්**

පිරිවැය වශයෙන් ලද මිලියන 3.5 ක මුදල පහත දැක්වෙන ආකාරයෙන් වැය කොට ඇත

| කාර්යය | මුදල් ප්‍රමාණය (මිලියන) |
| --- | --- |
| ගොඩනැගිලි පුණරුත්ථාපනය | - |
| ග්‍රන්ථ, රසායනාගාර සහ ඉගැන්වීම් උපකරණ මිලට ගැනීම | 3.5 |

පුණරාවර්ථන ලැබීම් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ දී ආයතනයට ලැබුණු මිලියන 72.909 ක මුදල පුද්ගල වැටුප් හා වේතන ගෙවීම සඳහාත්, විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් අභ්‍යසලාභින්ගේ විදේශ පුහුණුව සඳහාත් වැය කොට ඇත.

# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්ව විද්‍යාලය

2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

(සියළු මිළ ගණන් ආසන්න රුපියලට ගණනය කොට ඇත)

| 2009 රු. | | සටහන් | රු. | 2010 රු. |
|---|---|---|---|---|
| | **වත්කම්** | | | |
| | **ජංගම නොවන වත්කම්** | | | |
| 113,755,811 | දේපල,යන්ත්‍ර හා පිරිවිතර | 1 | 117,150,437 | |
| 71,153,534 | ආයෝජන - | 2 | 84,671,124 | 201,821,561 |
| 184,909,345 | | | | |
| | **ජංගම වත්කම්** | | | |
| 1,379,486 | තොග/භාණ්ඩ වට්ටෝරු | 3 | 1,555,059 | |
| 32,826,955 | වෙළඳ හා වෙනත් ලැබීම් | 4 | 37,582,878 | |
| 774,259 | පූර්ව ගෙවීම් | 5 | 738,645 | |
| 30,946,915 | මුදල් සහ මුදල් හා සමාන | 6 | 30,413,406 | 70,289,988 |
| 65,927,615 | **මුළු වත්කම්** | | | 272,111,549 |
| | **වගකීම්** | | | |
| | **ජංගම නොවන වගකීම්** | | | |
| | ණය පොළී | | | |
| 14,243,807 | පාරිතෝෂික වෙන් කිරීම් | | 13,689,198 | |
| | **ජංගම වගකීම්** | | | |
| 13,261,368 | ගෙවීම් | 7 | 4,810,631 | |
| 7,577,506 | උපචිත වියදම් | 8 | 9,683,503 | |
| | කෙටිකාලීන ණය | | ------------ | |
| | | | 14,494,134 | 28,183,332 |
| | **මුළු වගකීම්** | | | |
| 215,754,279 | **මුළු ශුද්ධ වත්කම්** | | | 243,928,217 |
| | **ශුද්ධ වත්කම්/ රාජ්‍ය ආධාර** | | | |
| 269,522,067 | සමුච්චිත අරමුදල | 9 | | 289,166,209 |
| (53,767,788) | සංචිත | 10 | | (45,237,992) |
| 215,754,279 | **මුළු වත්කම්/ රාජ්‍ය ආධාර** | | | 243,928,217 |

නිවැරදි බවට සහතික කරන ලදී.

ගිණුම් නිලධාරී (අධ්‍යක්ෂ)

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්ව විද්‍යාලය

2010 දෙසැම්බර් 31 දිනට ආදයම් හා වියදම් ගිණුම

(සියළු මිළ ගණන් ආසන්න රුපියලට ගණනය කොට ඇත)

| 2009 රු. | | සටහන | රු. | 2010 රු. |
|---|---|---|---|---|
| | **ආදයම** | 11 | | |
| 74,800,000 | රජයේ දීමනා | | | 72,909,000 |
| 96,423,131 | වෙනත් ආදයම් | | | 104,342,536 |
| 171,223,131 | | | | 177,251,536 |
| | **වියදම්** | | | |
| | පුනරාවර්ථන වියදම් | 12 | | |
| 45,654,336 | පුද්ගල වැටුප් හා වේතන | | 50,624,423 | |
| 5,977,589 | ගමන් වියදම් | | 6,304,450 | |
| 6,410,950 | සැපයීම් | | 6,099,831 | |
| 2,244,410 | නඩත්තු | | 2,610,877 | |
| 11,636,508 | කොන්ත්‍රාත් සේවා | | 13,726,134 | |
| 29,754,679 | වෙනත් පුනරාවර්ථන වියදම් | | 26,678,122 | |
| 23,580,936 | පශ්චාත් උපාධි පුහුණුවීම් | | 21,605,495 | |
| 125,259,408 | | | 127,649,332 | |
| 884,915 | පරිතෝෂික | | 961,209 | |
| 18,424,209 | ක්ෂය | | 21,290,675 | 149,901,216 |
| 26,654,599 | ආදායමට වැඩි අතිරික්තය / ඌණතාවය | | | 27,350,320 |
| | **විසර්ජන ගිණුම** | | | |
| (72,472,309) | පෙර වසරින් ඉදිරියට ගෙන ආ ශේෂය | | (53,767,788) | |
| | **එකතු කළා** | | | |
| 15,484,406 | වෙනත් ගැළපුම් (බැර) | 13 | 1,267,261 | (52,500,527) |
| (30,333,304) | | | | |
| | **අඩු කළා** | | | |
| 1,449,458 | පසුගිය වසරට අදාළ ගෙවීම් | | 2,671,112 | |
| 21,985,026 | වෙනත් ගැළපුම් (හර) | 14 | 17,416,673 | 20,087,785 |
| (53,767,788) | ශේෂපත්‍රයට ගෙන ගිය ඉතිරිය | | | (45,237,992) |

## 31.12.2010 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය වාර්තාව

| | ආදායම හා වියදම | 2009 රුපියල් | 2010 රුපියල් |
|---|---|---|---|
| | **ආදායම** | | |
| 01 | පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන (පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන්ගේ ශිෂ්‍යත්ව අරමුදල් ද ඇතුලත්ව) | 74,800,000 | 72,909,000 |
| 02 | ආයතනයේ ඉපයීම්වලින් ලත් ආදායම | 96,423,131 | 104,342,536 |
| 03 | වැටුප් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලද ප්‍රතිපාදන | | |
| 04 | 27 වැනි වර්ෂ පූර්ණ සැමරුම් උත්සවය සඳහා ලද ආධාර | | |
| | | 171,223,131 | 177,251,536 |
| | **අඩු කළා: වියදම්** | | |
| 1 | **පුනරාවර්ථන වියදම්** | | |
| 1.1 | පුද්ගල වැටුප් හා වේතන | 45,654,336 | 50,624,423 |
| 1.2 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 5,977,589 | 6,304,450 |
| 1.3 | සැපයුම් | 6,410,950 | 6,099,831 |
| 1.4 | නඩත්තු | 2,244,410 | 2,610,877 |
| 1.5 | කොන්ත්‍රාත් පදනම මත සේවා ලබාගැනීම් | 11,636,508 | 13,726,134 |
| 1.6 | වෙනත් පුනරාවර්ථන වියදම් | 29,754,679 | 26,678,122 |
| 1.7 | පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් සඳහා වූ ශිෂ්‍යත්ව අරමුදල් | 23,580,936 | 21,605,495 |
| | | 125,259,408 | 127,649,332 |
| | පාරිතෝෂික | 884,915 | 961,209 |
| | ක්ෂයවීම් | 18,424,209 | 21,290,675 |
| | | 144,568,532 | 149,901,216 |
| | අතිරික්තය/හිඟය | 26,654,599 | 27,350,320 |
| | **ප්‍රාග්ධන අරමුදල** | | |
| 1 | ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම් | 1,700,000 | |
| 2 | විද්‍යාගාර, ඉගැන්වීම් හා කාර්යාලයීය දැව භාණ්ඩ හා උපකරණ | 850,000 | 1,500,000 |
| 3 | පුස්තකාල පොත් හා වාර සඟරා | 5,900,000 | 3,500,000 |
| 2 | **ප්‍රාග්ධන වැය** | | |
| 2.1 | ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම් | 2,412,442 | 2,958,074 |
| 2.2 | විද්‍යාගාර, ඉගැන්වීම් හා කාර්යාලයීය දැව භාණ්ඩ හා උපකරණ | 850,000 | 1,500,000 |
| 2.3 | පුස්තකාල පොත් හා වාර සඟරා | 3,003,098 | 3,732,215 |

## කළමණාකරණ මණ්ඩලය

ආයතනයේ කළමණාකරණ මණ්ඩලය පහත සඳහන් සාමාජික හවතුන්ගෙන් සමන්විත වීය (2010 දෙසැම්බර් 31 දක්වා)

### නිළ වශයෙන් සමාජිකත්වය හිමි හවතුන්

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රිස්වි ෂෙරීෆ් මයා | - අධ්‍යක්‍ෂ |
| මහාචාර්ය ලලිතා මෙන්ඩිස් මිය | - ආසන්නතම පූර්වගාමී අධ්‍යක්‍ෂ |
| මහාචාර්ය කාලෝ ෆොන්සේකා මයා | - විශ්ව විද්‍යාල කොමිෂන් සභාවේ සභාපතිගේ නාමිත |
| ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මයා | - ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය |
| වෛද්‍ය ටී.ආර්.සී. රුබේරු මයා | - ලේකම්, සෞඛ්‍ය අමාත්‍යංශය |
| ආර්.එම්.පී. රත්නායක මයා | - මුදල් අමාත්‍යංශයේ ලේකම්ගේ නාමිත |
| වෛද්‍ය අජිත් මෙන්ඩිස් මයා | - සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ ජනරාල් |
| වෛද්‍ය එස්.ටී.ජී.ආර්.ද. සිල්වා මයා | - නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්/වෛද්‍ය සේවා |
| මහාචාර්ය හර්ෂලාල් සෙනෙවිරත්න මයා | - පීඨාධිපති, වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය ජයන්ත ජයවර්ධන මයා | - පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (සභාපති) |
| මහාචාර්ය ඒ.ආර්. වික්‍රමසිංහ මයා | - පීඨාධිපති, වෛද්‍ය පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය ටී ආර් වීරසූරිය මයා | - පීඨාධිපති, වෛද්‍ය පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය |
| වෛද්‍ය කේ. සිවපාලන් මයා | - පීඨාධිපති, වෛද්‍ය පීඨය, යාපනය විශ්ව විද්‍යාලය |
| වෛද්‍ය ගාමිණී බුත්පිටිය මයා | - පීඨාධිපති, වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය උපුල් බී.දිසානායක මයා | - පීඨාධිපති, දන්ත පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය එම් උඩුපිහිල්ල මිය | - පීඨාධිපති, වෛද්‍ය හා සමසෞඛ්‍ය විද්‍යා පීඨය,රජරට විශ්ව විද්‍යාලය |
| වෛද්‍ය කේ ඊ කරුණාකරන් | - පීඨාධිපති, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය, අග්නිදිග විශ්ව විද්‍යාලය |

### විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත් කළ සාමාජික හවතුන්

මහාචාර්ය අබ්දුල් හුසේන් මයා
එන්.සෙල්වක්කුමාරන් මයා
වෛද්‍ය ලූෂන් ජයසූරිය මයා
එම්.ඩී.ඩී.පීරිස් මයා
මහාචාර්ය රොහාන් ජයසේකර මයා
මහාචාර්ය ලාල් ජයකොඩි මයා
මහාචාර්ය එච් ජනක ද සිල්වා මයා
වෛද්‍ය සරත් පරණවිතාන මයා

### අධ්‍යයන අංශ ප්‍රධානීන් අතුරින් එක් එක් වෛද්‍ය සහ දන්ත පීඨය මගින් තෝරාගත් සාමාජික හවතුන්

| | |
|---|---|
| වෛද්‍ය එම් ඩබ් ගුණතුංග මයා | (අංශාධිපති, ප්‍රජා වෛද්‍ය විද්‍යා අංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය) |
| වෛද්‍ය සමත් ධර්මරත්න මයා | (අංශාධිපති, ප්‍රජා වෛද්‍ය විද්‍යා අංශය, වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය) |
| වෛද්‍ය ටී. එස්. නවරත්නරාජා මිය | (අංශාධිපති, ක්‍ෂුද්‍ර ජීව වෛද්‍යවේද අංශය, වෛද්‍ය පීඨය, යාපනය විශ්ව විද්‍යාලය) |
| මහාචාර්ය එම්.එච්.ජේ. ආරියරත්න මයා | (අංශාධිපති, ශල්‍ය වෛද්‍ය අංශය, වෛද්‍ය පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය) |
| මහාචාර්ය මිරානි වීරසූරිය මිය | (අංශාධිපති, පරපෝෂිත වෛද්‍යවේද අංශය, වෛද්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය) |
| මහාචාර්ය මොහාන් ද සිල්වා මයා | (අංශාධිපති, ශල්‍ය වෛද්‍ය අංශය, වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය) |
| මහාචාර්ය එස්.එල්. ඒකනායක මයා | (අංශාධිපති, ප්‍රජා දන්ත වෛද්‍යවිද්‍යා අංශය, දන්ත වෛද්‍යපීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය) |

2010 වර්ෂයේ ආයතනයේ බලමණ්ඩලවල සභාපතිවරු සහ ලේකම්වරු

| **බල මණ්ඩලය** | **සභාපති** | **ලේකම්** |
|---|---|---|
| කළමණාකරණ මණ්ඩලය | මහාචාර්ය ජයන්ත ජයවර්ධන | බී. ජී. චන්ද්‍රදාස |

| **අධ්‍යයන මණ්ඩලය** | **සභාපති** | **ලේකම්** |
|---|---|---|
| නිර්වින්දන වෛද්‍යවේදය | වෛද්‍ය එස් හපුආරච්චි | වෛද්‍ය කේ. රණතුංග |
| සායනික නියෝප්ලාස්මවේදය | වෛද්‍ය මහේන්ද්‍ර පෙරේරා | වෛද්‍ය ටී. ස්කන්දරාජා |
| ප්‍රජා වෛද්‍යවේදය | මහාචාර්ය ආර්. සෙනෙවිරත්න | වෛද්‍ය උපුල් සෙනරත් |
| දන්ත ශල්‍යවේදය | වෛද්‍ය ජේ.යූ. වීරසිංහ | වෛද්‍ය ගාමිණී නවරත්න |
| චර්ම වෛද්‍යවේදය | වෛද්‍ය පී.එම්.පී. සිරිමාන්න | මහාචාර්ය ජේ.කේ.කේ. සෙනෙවිරත්න |
| පවුල් වෛද්‍යවේදය | මහාචාර්ය  නන්දනී ද සිල්වා | වෛද්‍ය ආර්.පී.ජේ.සී. රාමනායක |
| අධිකරණ වෛද්‍ය විද්‍යාව | වෛද්‍ය ඒ.සමරසේකර | වෛද්‍ය පී.ඒ.එස්.එදිරිසිංහ |
| වෛද්‍ය පරිපාලනය | වෛද්‍ය එස්.ටී.ජී.ආර්. ද සිල්වා | වෛද්‍ය එස්.සී. වික්‍රමසිංහ |
| කායික වෛද්‍යවේදය | වෛද්‍ය එම්.කේ. රගුනාදන් | වෛද්‍ය එස්.ඒ.ඒ.පී. කරුණානායක |
| ක්ෂුද්‍ර ජීව වෛද්‍යවේදය | මහාචාර්ය නෙළුන් ද සිල්වා | වෛද්‍ය ඒ. නාගහවත්ත |
| ධාත්‍රීභෘත්‍යය හා නාරිවේදය | මහාචාර්ය අයි.එම්.ආර්. ගුණවර්ධන | වෛද්‍ය අතුල කළුආරච්චි |
| අක්ෂි වෛද්‍යවේදය | වෛද්‍ය චම්පා බී. බානගල | වෛද්‍ය චරිත් ෆොන්සේකා |
| නාසාකණ්ඨස්වරාලවේදය | වෛද්‍ය ආර්.පී. දයාසේන | වෛද්‍ය ඒ.ඩී.කේ.එස්.එන්.යසවර්ධන |
| කෞමාරභෘත්‍යය | මහාචාර්ය එම්. සේනානායක | වෛද්‍ය ජේ. වනිගසිංහ |
| ව්‍යාධිවේදය | වෛද්‍ය එන්.වී.අයි. රත්නතුංග | වෛද්‍ය එල්.වී. ගුණරත්න |
| මනෝ වෛද්‍යවේදය | වෛද්‍ය රවීන් හන්වැල්ල | වෛද්‍ය ආර්. වීරසුන්දර |
| විකිරණවේදය | වෛද්‍ය එන්.ජේ. අබේගුණවර්ධන | වෛද්‍ය එස්. වීරකෝන් |
| ශල්‍යවේදය | වෛද්‍ය කේ.යූ.ආර්.ඒ. බානගල | වෛද්‍ය එස්. කේ. චන්ද්‍රසේකර |
| ක්‍රීඩා වෛද්‍ය (අන්තර්කාලීන) | මහාචාර්ය රොහාන් ජයසේකර(2010 මැයි දක්වා)<br>වෛද්‍ය එල්.විජයරත්න (2010 ජූලි සිට) | වෛද්‍ය එල්.විජයරත්න(2010 මැයි දක්වා)<br>වෛද්‍ය තාෂි චෑං (2010 ජූලි සිට) |
| සමාජරෝග වෛද්‍යවේදය | වෛද්‍ය කේ. බුද්ධකෝරාල | වෛද්‍ය එල්.අයි. රාජපක්ෂ |
| බහු විෂය ක්ෂේත්‍රයීය අධ්‍යයන පාඨමාලා | මහාචාර්ය රිස්වි ෂෙරිෆ් | වෛද්‍ය පණ්ඩුල සිරිබද්දන |



උසස් අධ්‍යාපන අමාත්‍යංශය
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
කොළඹ විශ්ව විද්‍යාලය
සනාථන සභාව
පාලක සභාව
